# ක්‍රිස්තියානි ධර්මය

## ගුරු මාර්ගෝපදේශය

### දෙවන ශ්‍රේණිය

**(2017 වර්ෂයේ සිට ක්‍රියාත්මක වේ.)**


මූල් ළමාවිය සංවර්ධන හා ප්‍රාථමික අධ්‍යාපන දෙපාර්තමේන්තුව
ජාතික අධ්‍යාපන ආයතනය
මහරගම
ශ්‍රී ලංකාව

විද්‍යුත් තැපැල : info @ nie.lk
වෙබ් අඩවිය : www.nie.lk

# ක්‍රිස්තියානි ධර්මය

**දෙවන ශ්‍රේණිය**

**ගුරු මාර්ගෝපදේශය**

ප්‍රථම මුද්‍රණය - 2016

© ජාතික අධ්‍යාපන ආයතනය

ISBN .................

මුල් ළමාවිය සංවර්ධන හා ප්‍රාථමික අධ්‍යාපන දෙපාර්තමේන්තුව
භාෂා, මානව ශාස්ත්‍ර සහ සමාජ විද්‍යා පීඨය
ජාතික අධ්‍යාපන ආයතනය
ශ්‍රී ලංකාව

වෙබ් අඩවිය : www.nie.lk
විද්‍යුත් තැපෑල : info @ nie.lk

*මුද්‍රණය* :

# අධ්‍යක්ෂ ජනරාල්තුමියගේ පණිවිඩය

ජාතික අධ්‍යාපන කොමිෂන් සභාව විසින් නිර්දේශිත ජාතික අධ්‍යාපන අරමුණු සාක්ෂාත් කර ගැනීම සහ පොදු නිපුණතා සංවර්ධනය කිරීමේ මූලික අරමුණ සහිත ව එවකට පැවති අන්තර්ගතය පදනම් වූ විෂයමාලාව නවීකරණයට භාජනය කොට වර්ෂ අටකින් යුතු චක්‍රයකින් සමන්විත නව නිපුණතා පාදක විෂයමාලාවෙහි පළමු අදියර, වර්ෂ 2007 දී ජාතික අධ්‍යාපන ආයතනය විසින් ශ්‍රී ලංකාවේ ප්‍රාථමික හා ද්විතීයික අධ්‍යාපන ක්ෂේත්‍රයට හඳුන්වා දෙන ලදි.

පර්යේෂණවලින් අනාවරණය වූ කරුණු ද, අධ්‍යාපනය පිළිබඳ ව විවිධ පාර්ශ්වයන් ඉදිරිපත් කළ යෝජනා ද පදනම් කොට ගෙන සිදු කරන ලද විෂයමාලා තාර්කීකරණය කිරීමේ ක්‍රියාවලියක ප්‍රතිඵලයක් ලෙස විෂයමාලා චක්‍රයේ දෙවැනි අදියර අධ්‍යාපන ක්ෂේත්‍රයට හඳුන්වා දීම 2015 වසරේ සිට ආරම්භ කර ඇත.

මෙම තාර්කීකරණ ක්‍රියාවලියේ දී සියලු ම විෂයයන්ගේ නිපුණතා පදනම් මට්ටමේ සිට උසස් මට්ටම දක්වා ක්‍රමානුකූල ව ගොඩ නැඟීම සඳහා පහළ සිට ඉහළට ගමන් කරන සිරස් සංකලනය භාවිත කර ඇති අතර විවිධ විෂයයන්හි දී එක ම විෂය කරුණු නැවත නැවත ඉදිරිපත් වීම හැකිතාක් අවම කිරීම, විෂය අන්තර්ගතය සීමා කිරීම සහ ක්‍රියාත්මක කළ හැකි ශිෂ්‍ය මිතුරු විෂයමාලාවක් සැකසීම සඳහා තිරස් සංකලනය ද භාවිත කර ඇත.

ගුරු භවතුන්ට පාඩම් සැලසුම් කිරීම, ඉගෙනුම්-ඉගැන්වීම් ක්‍රියාවලියෙහි සාර්ථක ව නිරත වීම, පන්ති කාමර මිනුම් හා ඇගයීම් ප්‍රයෝජනවත් පරිදි යොදා ගැනීම සඳහා අවශ්‍ය වන මාර්ගෝපදේශ ලබාදීමේ අරමුණින් නව ගුරු මාර්ගෝපදේශ හඳුන්වා දී ඇත. පන්ති කාමරය තුළ දී වඩාත් ඵලදායී ගුරුවරයෙකු ලෙස කටයුතු කිරීමට මෙම මාර්ගෝපදේශ උපකාරී වනු ඇත. සිසුන්ගේ නිපුණතා වර්ධනය කිරීම සඳහා ගුණාත්මක යෙදවුම් හා ක්‍රියාකාරකම් තෝරා ගැනීමට ගුරුවරුන්ට අවශ්‍ය නිදහස මෙමගින් ලබා දී තිබේ. එමෙන් ම නිර්දේශිත පාඨ ග්‍රන්ථවල ඇතුළත් වන විෂය කරුණු පිළිබඳ ව වැඩි බර තැබීමක් මෙම ගුරු මාර්ගෝපදේශවල අන්තර්ගත නොවේ. එම නිසා මෙම ගුරු මාර්ගෝපදේශය වඩාත් ඵලදායී වීමට නම් අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුව විසින් සකසා ඇති අදාළ පාඨ ග්‍රන්ථ සමග සමගාමී ව භාවිත කිරීම අත්‍යවශ්‍ය වේ.

තාර්කීකරණය කරන ලද විෂය නිර්දේශ, නව ගුරු මාර්ගෝපදේශ හා නව පාඨ ග්‍රන්ථවල මූලික අරමුණු වන්නේ ගුරු කේන්ද්‍රීය අධ්‍යාපන රටාවෙන් මිදී ශිෂ්‍ය කේන්ද්‍රීය අධ්‍යාපන රටාවක් හා වඩාත් ක්‍රියාකාරකම් මත පදනම් වූ අධ්‍යාපන රටාවකට එළඹීම මගින් වැඩ ලෝකයට අවශ්‍ය වන්නා වූ නිපුණතා හා කුසලතාවන්ගෙන් යුක්ත මානව සම්පතක් බවට ශිෂ්‍ය ප්‍රජාව සංවර්ධනය කිරීමයි.

නව විෂය නිර්දේශ සහ ගුරු මාර්ගෝපදේශ සම්පාදනය කිරීමේ දී ජාතික අධ්‍යාපන ආයතනයේ ශාස්ත්‍රීය කටයුතු මණ්ඩලයේ ද, ආයතන සභාවේ ද, රචනයේ දී දායකත්වය ලබා දුන් සියලු ම සම්පත්දායකයින් හා වෙනත් පාර්ශ්වයන්ගේ ද ඉමහත් කැපවීම ඇගයීමට ද මෙය අවස්ථාවක් කර ගනු කැමැත්තෙමි.

**ආචාර්ය ජයන්ති ගුණසේකර**
**අධ්‍යක්ෂ ජනරාල්**
**ජාතික අධ්‍යාපන ආයතනය**
**මහරගම**

# නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල් හිමි ගේ පණිවිඩය

ඉගෙනුම පුළුල් ක්ෂේත්‍රයක විහිද යන්නකි. එය ජීවිත අතිමහත් බවට ද, ඉතා ම සරල බවට ද පත් කරයි. මනුෂ්‍යයා ඉගෙනුම් කුසලතාවෙන් උත්කෘෂ්ට ය. මානව සමාජ සංවර්ධනය කේන්ද්‍ර කොට ගත් රටක්, සමාජයක් බුද්ධිය විසින් හඳුනා ගත් අසම්මත බැහැර කිරීමට ද, සුභාවිත තුළින් නව ලොවක් නිර්මාණය කර ගැනීමට ද, මෙවලම කර ගනු ලබන්නේ ඉගෙනුම යි.

ඉගෙනුම සඳහා වටිනා යමක් ද, ඉගෙනුම් ක්‍රමවේද හා පහසුකම් ද, අධ්‍යාපනය වටා නිර්මාණය විය යුතු ය. විෂයමාලාව, විෂය නිර්දේශය, මාර්ගෝපදේශ සහ සුසාධ්‍යකරුවන් ඉගෙනුම් ක්ෂේත්‍රයට එක් වනුයේ මේ ආකාරයෙනි.

නූතන ශ්‍රී ලංකාව ගෝලීය ප්‍රවණතා මෙන් ම පුරාතන උරුම ද සම්මිශ්‍රණය කර ගනිමින් ස්වීය අධ්‍යාපන රටාවක් හිමි කර ගෙන ඇත. කාලීන අවශ්‍යතා මත ප්‍රතිසංස්කරණ තුළින් වසර අටකට වරක් යාවත්කාලීන වන විෂයමාලාවේ ඉගෙනුම් සම්පතක් ලෙස මෙම ගුරු මාර්ගෝපදේශය නිර්මාණය වේ.

විෂයයෙහි අරමුණුවල සංගතතාව ජාතික මට්ටමින් පවත්වා ගත යුතු ය. එහෙත් ගුරු මාර්ගෝපදේශවල ඉගෙනුම් ක්‍රමවේද, අකුරක් වත් වෙනස් නො කොට පිළිපැදිය යුත්තක් නම් නො වේ. විෂය නිර්දේශයෙහි තේමා සහ නිපුණතා සාධනය වීම සඳහා අන්තර්ගතය තුළින් ඉගෙනුම් පල සම්ප්‍රාප්තිය පිණිස ඉගෙනුම් ක්‍රමවේද නිර්මාණශීලී ව වෙනස් කර ගැනීමට සුසාධ්‍යකරුවන්ට පැහැදිලි ව ම ඉඩක් ඇති බව සඳහන් කරමි. ශිෂ්‍ය සාධන ප්‍රතිශතය ඉහළ මට්ටමකට ගැනීම සඳහා උදව් වන, පහසුකම් සලසන, ගුරු භූමිකාවට කිසියම් ප්‍රවේශයක් සඳහා නිර්මාණය වන ගුරු මාර්ගෝපදේශය ශික්ෂකයා හට ද, දෙගුරුනට ද, භාවිත කළ හැකි ය. අදාළ පෙළ පොතට සහකරුවකු වන ගුරු මාර්ගෝපදේශය තවත් පෙළ පොතක් නො වන බව දැන ගුරු භවතුන් පෙළ පොත හා මාර්ගෝපදේශය යන සම්පත් ද්‍රව්‍ය දෙක ම භාවිත කළ යුතු ය.

ඒ ඒ විෂයවල සාධනය පිළිබඳ ඇගයීම් සිදු කරන ජාතික මට්ටමේ පරීක්ෂකවරයකු වුව ද අපේක්ෂා කරන සාධන, විෂයය ඉගැන්වීමට මඟ පෙන්වන සුසාධ්‍යකරුවන් විසින් පාඩම අවසානයෙහි පන්ති කාමරයේ දී දරුවන් සමඟ ප්‍රත්‍යක්ෂකරණයට පත් විය යුතු ය. එම ඒකාත්මික වීම සඳහා වූ ප්‍රබෝධාත්මක සංස්කෘතියක් ගොඩනගා ගැනීමට ගුරු මාර්ගෝපදේශය පහුරක්, යාත්‍රාවක් කර ගනු ඇතැ යි ආයාචනා පූර්වක ව අපේක්ෂා කරමි.

**පීඨාධිපති, නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල්**
**භාෂා, මානව ශාස්ත්‍ර හා සමාජවිද්‍යා පීඨය,**
**ජාතික අධ්‍යාපන ආයතනය.**

# විෂයමාලා කමිටුව

**උපදේශකත්වය හා අනුමතිය :**

| | | |
|---|---|---|
| උපදේශකත්වය | : | ආචාර්ය පූජ්‍ය මාඹුල්ගොඩ සුමනරතන හිමි<br>නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල් |
| | | ගරු ඩබ්ලිව්. පී. එබනේසර් ජෝසප් දේවගැතිතුමා<br>මහ ලේකම්, ශ්‍රී ලංකා ජාතික ක්‍රිස්තියානි මණ්ඩලය |
| | | ගරු ජේ. ඒ. මිහිරි ද සිල්වා දේවගැතිතුමිය<br>විධායක ලේකම්, ශ්‍රී ලංකා ජාතික ක්‍රිස්තියානි මණ්ඩලය<br>අධ්‍යාපන කොමිසම |
| | | ගරු එස්. ඒ. ඒ. ප්‍රනාන්දු පියතුමා, සහකාර කථිකාචාර්ය,<br>ජාතික අධ්‍යාපන ආයතනය |
| | | එම්. ඒ. ජී. ඩබ්ලිව්. කුලරත්න මයා,<br>අධ්‍යක්ෂ (මුල් ළමාවිය සංවර්ධන හා ප්‍රාථමික අධ්‍යාපන) |
| අනුමැතිය | : | ශාස්ත්‍රීය කටයුතු මණ්ඩලය, ජාතික අධ්‍යාපන ආයතනය |
| විෂය සම්බන්ධීකරණය | : | කේ. ආර්. එම්. සකුන්තලා රණසිංහ මිය,<br>සහකාර කථිකාචාර්ය, ජාතික අධ්‍යාපන ආයතනය. |

**ලේඛක මණ්ඩලය :**

| | | |
|---|---|---|
| බාහිර සම්පත් දායකත්වය | : | ගරු ජේ. ඒ. මිහිරි ද සිල්වා දේවගැතිතුමිය<br>විධායක ලේකම්, ජාතික ක්‍රිස්තියානි මණ්ඩලය, අධ්‍යාපන කොමිසම. |
| | | එම්. රදීකා සමන්ති මෙන්ඩිස් මිය,<br>ගුරු සේවය, ශාන්ත තෝමස් විදුහල, ගල්කිස්ස |
| | | එම්. පී. සෙල්වනිධි පෙරේරා මිය,<br>ගුරු සේවය (විශ්‍රාමික) |
| | | එම්. අයි. එන්. එන්. සේනාරත්න මිය<br>ගුරු උපදේශක, කටාන කොට්ඨාස අධ්‍යාපන කාර්යාලය, |
| | | ඩී. ආර්. බී. මදුරාගොඩ මිය<br>ගුරු සේවය, මෙතෝදිස්ත උසස් විද්‍යාලය, මොරටුව. |
| | | ඒ. කිතුමිණි සල්ගාදු මිය ,<br>ගුරු සේවය, කටුනායක මහා විද්‍යාලය, මීගමුව. |
| | | ඩී. එස්. පුෂ්පකුමාරි මිය,<br>ගුරු සේවය, කුරු/ලක්දාස් ඩි මෙල් විද්‍යාලයය |
| භාෂා සංස්කරණය | : | ශ්‍රීනාත් ගනේවත්ත මයා<br>(භාෂා සංස්කාරක) |

| | | |
|---|---|---|
| **පරිගණක වදන් සැකසුම** | : | බී. ඒ. එන්. බටවල මිය |
| **විවිධ සහය** | : | ඩබ්ලිව්. එච්. ටී. සිල්වා මයා<br>එස්. පී. ඒ. සරත් කුමාර මයා |

# හැඳින්වීම

ජාතික අරමුණු ඉටු කර ගැනීම සඳහා පාදක වන මූලික නිපුණතා ඇසුරින් 'ආගම සහ ආචාර ධර්මවලට අදාළ නිපුණතා' දරුවන් තුළ ගොඩ නැංවීම 'ආගම' විෂයයේ වගකීම වෙයි.

කුඩා දරුවකුගේ ළපටි මනසෙහි අලුත් යමක් රෝපණය කිරීම පහසු ය, එසේ ම යහපත් චර්යාවලට සහ වත් පිළිවෙත්වලට කුඩා දරුවකු අනුගත කිරීම ද වඩා ඉක්මනින් කළ හැකි ය. කුඩා දරුවකු තුළ පවත්නා එම ගුණාංගවලට මනා ව ගැළපෙන සේ මෙහි විවිධ ක්‍රියාකාරකම් යෝජනා කර ඇත. විෂය අන්තර්ගතයට අනුකූල ව සිසු දරුවාට අදාළ නිපුණතාව ලබා දෙමින් ඉගෙනුම් පල සාක්ෂාත් කර ගැනීමට එම ක්‍රියාකාරකම් ඔබට මාර්ගෝපදේශයක් වනු ඇතැ යි අපේක්ෂා කෙරේ.

සමාජයක සාමය සහ සදාචාරය පවත්වා ගැනීමට සියලු ම ආගම්වලින් ලැබෙන දායකත්වය සුළුපටු නො වේ. තව ද, තමා හැම අයුරින් ම පෝෂණය කර ගුණාත්මක ජීවිතයක් ගත කිරීමට ශ්‍රම දායකත්වය සපයන මිනිස් සමාජයට කෘතවේදී වෙමින් පෙරළා අවංක සේවයක් කිරීමටත්, යහගුණවලින් හෙබි මනුෂ්‍යයකු ලෙස අභිමානයෙන් යුතු ව ජීවත් වීමටත්, ආගමකින් ලැබෙන පන්නරය අතිමහත් ය. එ පමණක් නො ව අප එකිනෙකා විශ්වාස කරන පරිදි මරණින් ඔබ්බෙහි දී ද යහපතක් උදා කර ගැනීම සඳහා ආගමික ඉගැන්වීම් අපට නිසැක ව ම පිහිට වෙයි.

දැහැමි සමාජයක් බිහි කිරීමේ උදාර කර්තව්‍යය ආරම්භ කළ යුත්තේ ප්‍රාථමික අවධියේ කුඩා දරුවා ගෙනි. ඒ මහඟු කර්තව්‍යය භාර ගෙන සිටින භාග්‍යවන්ත වූ ගුරු භවතා ඔබ යි. ඒ සඳහා ඔබෙන් ලැබෙන දායකත්වය සහ කැප වීම මහත් සේ අගයමු.

**එම්. ඒ. ජී. ඩබ්ලිව්. කුලරත්න**<br>
**අධ්‍යක්ෂ,**<br>
**මුල් ළමාවිය සංවර්ධන හා ප්‍රාථමික අධ්‍යාපන දෙපාර්තමේන්තුව**

# ජාතික අරමුණු

i. මානව අභිමානයට ගරු කිරීමේ සංකල්පයක් මත පිහිටා ශ්‍රී ලාංකික බහුවිධ සමාජයේ සංස්කෘතික විවිධත්වය අවබෝධ කර ගනිමින් ජාතික ඒකාබද්ධතාව, ජාතික ඍජු ගුණය, ජාතික සමඟිය, එකමුතුකම සහ සාමය ප්‍රවර්ධනය කිරීම තුළින් ජාතිය ගොඩනැඟීම සහ ශ්‍රී ලාංකීය අනන්‍යතාව තහවුරු කිරීම

ii. වෙනස් වන ලෝකයක අභියෝගවලට ප්‍රතිචාර දක්වන අතර ජාතික උරුමයේ මාහැඟි දායාද හඳුනා ගැනීම සහ සංරක්ෂණය කිරීම

iii. මානව අයිතිවාසිකම්වලට ගරු කිරීම, යුතුකම් හා වගකීම් පිළිබඳ දැනුවත් වීම සහ හෘදයාංගම බැඳීමකින් යුතු ව එකිනෙකා කෙරෙහි සැලකිලිමත් වීම යන ගුණාංග ප්‍රවර්ධනය කිරීමට ඉවහල් වන සමාජ සාධාරණත්ව සම්මත සහ ප්‍රජාතාන්ත්‍රික ජීවන රටාවක් ගැබ් වූ පරිසරයක් නිර්මාණය කිරීම සහ පවත්වා ගෙන යාමට සහාය වීම

iv. පුද්ගලයින් ගේ මානසික හා ශාරීරික සුව සම්පත සහ මානව අගයවලට ගරු කිරීම මත පදනම් වූ තිරසාර ජීවන ක්‍රමයක් ප්‍රවර්ධනය කිරීම

v. සුසමාහිත වූ සමබර පෞරුෂයක් සඳහා නිර්මාපණ හැකියාව, ආරම්භක ශක්තිය, විචාරශීලී චින්තනය, වගකීම හා වගවීම ඇතුළු වෙනත් ධනාත්මක අංග ලක්ෂණ සංවර්ධනය කිරීම

vi. පුද්ගලයා ගේ සහ ජාතියේ ජීව ගුණය වැඩිදියුණු කෙරෙන සහ ශ්‍රී ලංකාවේ ආර්ථික සංවර්ධනය සඳහා දායක වන ඵලදායී කාර්ය සඳහා අධ්‍යාපනය තුළින් මානව සම්පත් සංවර්ධනය කිරීම

vii. ශීඝ්‍රයෙන් වෙනස් වන ලෝකයක් තුළ සිදු වන වෙනස්කම් අනුව හැඩ ගැසීමට හා ඒවා පාලනය කර ගැනීමට පුද්ගලයින් සූදානම් කිරීම සහ සංකීර්ණ හා අනපේක්ෂිත අවස්ථාවලට සාර්ථක ව මුහුණ දීමේ හැකියාව වර්ධනය කිරීම

viii. ජාත්‍යන්තර ප්‍රජාව අතර ගෞරවනීය ස්ථානයක් හිමි කර ගැනීමට දායක වන යුක්තිය, සමානත්වය සහ අන්‍යෝන්‍ය ගරුත්වය මත පදනම් වූ ආකල්ප හා කුසලතා පෝෂණය කිරීම

# මූලික නිපුණතා

අධ්‍යාපනය තුළින් වර්ධනය කෙරෙන පහත දැක්වෙන මූලික නිපුණතා ඉහත සඳහන් ජාතික අරමුණු මුදුන්පත් කර ගැනීමට දායක වනු ඇත.

## i. සන්නිවේදන නිපුණතා

සාක්ෂරතාව, සංඛ්‍යා පිළිබඳ දැනුම, රූපක භාවිතය සහ තොරතුරු තාක්ෂණ ප්‍රවීණත්වය යන අනුකාණ්ඩ හතරක් මත සන්නිවේදන නිපුණතා පදනම් වේ.

**සාක්ෂරතාව** : සාවධාන ව ඇහුම්කන් දීම, පැහැදිලි ව කතා කිරීම, තේරුම් ගැනීම සඳහා කියවීම, නිවැරැදි ව සහ නිරවුල් ව ලිවීම, ඵලදායී අයුරින් අදහස් හුවමාරු කර ගැනීම

**සංඛ්‍යා පිළිබඳ දැනුම** : භාණ්ඩ, අවකාශය හා කාලය, ගණන් කිරීම, ගණනය සහ මිනුම් සඳහා ක්‍රමානුකූල ඉලක්කම් භාවිතය

**රූපක භාවිතය** : රේඛා සහ ආකෘති භාවිතයෙන් අදහස් පිළිබිඹු කිරීම සහ රේඛා, ආකෘති සහ වර්ණ ගළපමින් විස්තර, උපදෙස් හා අදහස් ප්‍රකාශනය හා වාර්තා කිරීම

**තොරතුරු තාක්ෂණ ප්‍රවීණත්වය** : පරිගණක දැනුම සහ ඉගෙනීමේ දී ද, සේවා පරිශ්‍රවල දී ද, පෞද්ගලික ජීවිතයේ දී ද, තොරතුරු සහ සන්නිවේදන තාක්ෂණය උපයෝගී කර ගැනීම

## ii. පෞරුෂත්ව වර්ධනයට අදාළ නිපුණතා

- නිර්මාණශීලී බව, අපසාරී චින්තනය, ආරම්භක ශක්තිය, තීරණ ගැනීම, ගැටලු නිරාකරණය කිරීම, විචාරශීලී හා විග්‍රහාත්මක චින්තනය, කණ්ඩායම් හැඟීමෙන් කටයුතු කිරීම, පුද්ගලාන්තර සබඳතා, නව සොයා ගැනීම් සහ ගවේෂණය වැනි වර්ගීය කුසලතා
- ඍජු ගුණය, ඉවසා දරා සිටීමේ ශක්තිය සහ මානව අභිමානයට ගරු කිරීම වැනි අගය
- චිත්තවේගී බුද්ධිය

## iii. පරිසරයට අදාළ නිපුණතා

මෙම නිපුණතා සාමාජික, ජෛව සහ භෞතික පරිසරවලට අදාළ වේ.

**සමාජ පරිසරය** : ජාතික උරුම පිළිබඳ අවබෝධය, බහුවාර්ගික සමාජයක සාමාජිකයන් වීම හා සම්බන්ධ සංවේදීතාව හා කුසලතාව, සාධාරණ යුක්තිය පිළිබඳ හැඟීම, සමාජ සම්බන්ධතා, පුද්ගලික චර්යා, සාමාන්‍ය හා නෛතික සම්ප්‍රදාය, අයිතිවාසිකම්, වගකීම්, යුතුකම් සහ බැඳීම්

**ජෛව පරිසරය** : සජීවී ලෝකය, ජනතාව සහ ජෛව පද්ධතිය, ගස්වැල්, වනාන්තර, මුහුදු, ජලය, වාතය සහ ජීවය, ශාක, සත්ත්ව හා මිනිස් ජීවිතයට සම්බන්ධ වූ අවබෝධය, සංවේදී බව හා කුසලතා

**භෞතික පරිසරය** : අවකාශය, ශක්තිය, ඉන්ධන, ද්‍රව්‍ය, භාණ්ඩ සහ මිනිස් ජීවිතයට ඒවායේ ඇති සම්බන්ධතාව, ආහාර, ඇඳුම්, නිවාස, සෞඛ්‍යය, සුව පහසුව, නින්ද, නිස්කලංකය, විවේකය, අපද්‍රව්‍ය සහ මළපහ කිරීම් යනාදිය හා සම්බන්ධ වූ අවබෝධය, සංවේදීතාව හා කුසලතාව ඉගෙනීම, වැඩ කිරීම සහ ජීවත් වීම සඳහා මෙවලම් සහ තාක්ෂණය ප්‍රයෝජනයට ගැනීමේ කුසලතා

iv. **වැඩ ලෝකයට සූදානම් වීමේ නිපුණතා**

- ආර්ථික සංවර්ධනයට දායක වීම
- තම වෘත්තීය ළැදියා සහ අභියෝග්‍යතා හඳුනා ගැනීම
- හැකියාවලට සරිලන අයුරින් රැකියාවක් තෝරා ගැනීම සහ වාසිදායක හා තිරසාර ජීවනෝපායක නිරත වීම යන හැකියා උපරිම කිරීමට හා ධාරිතාව වැඩි කිරීමට අදාළ සේවා නියුක්තිය හා සම්බන්ධ කුසලතා

v. **ආගම සහ ආචාර ධර්මවලට අදාළ නිපුණතා**

පුද්ගලයන්ට තම දෛනික ජීවිතයේ දී ආචාර ධර්ම, සදාචාරාත්මක හා ආගමානුකූල හැසිරීම් රටාවලට අනුගත වෙමින් වඩාත් උචිත දේ තෝරා එයට සරිලන සේ කටයුතු කිරීම සඳහා අදාළ අගය උකහා ගැනීම හා ස්වීයකරණය

vi. **ක්‍රීඩාව සහ විවේකය ප්‍රයෝජනයට ගැනීමේ නිපුණතා**


සෞන්දර්යය, සාහිත්‍යය, සෙල්ලම් කිරීම, ක්‍රීඩා හා මලල ක්‍රීඩා, විනෝදාංශ හා වෙනත් නිර්මාණාත්මක ජීවන රටා තුළින් ප්‍රකාශ වන විනෝදය, සතුට, ආවේග සහ එවන් මානුෂික අත්දැකීම්

vii. **ඉගෙනීමට ඉගෙනුම පිළිබඳ නිපුණතා**

ශීඝ්‍රයෙන් වෙනස් වන, සංකීර්ණ හා එකිනෙකා මත යැපෙන ලෝකයක පරිවර්තන ක්‍රියාවලියක් හරහා වෙනස් වීම් හසුරුවා ගැනීමේ දී හා ඊට සංවේදී ව හා සාර්ථක ව ප්‍රතිචාර දැක්වීමත්, ස්වාධීන ව ඉගෙන ගැනීමත්, සඳහා පුද්ගලයින්ට ශක්තිය ලබා දීම

# ප්‍රාථමික විෂයමාලා සැලැස්ම

| ජාතික පොදු නිපුණතා | දරුවන් හැඳින ගැනීම | 1 ප්‍රධාන අවධිය (1 ශ්‍රේණිය, 2 ශ්‍රේණිය) | 1 ප්‍රධාන අවධියට අදාළ අත්‍යවශ්‍ය නිපුණතා පිළිබඳ ප්‍රවීණතාව තහවුරු කිරීම | 2 ප්‍රධාන අවධිය (3 ශ්‍රේණිය, 4 ශ්‍රේණිය) | 2 ප්‍රධාන අවධියට අදාළ අත්‍යවශ්‍ය නිපුණතා පිළිබඳ ප්‍රවීණතාව තහවුරු කිරීම | 3 ප්‍රධාන අවධිය (5 ශ්‍රේණිය) | 3 ප්‍රධාන අවධියට අදාළ අත්‍යවශ්‍ය නිපුණතා පිළිබඳ ප්‍රවීණතාව තහවුරු කිරීම |
|---|---|---|---|---|---|---|---|
| . සන්නිවේදන නිපුණතා<br>. පෞරුෂත්ව වර්ධනයට අදාළ නිපුණතා<br>. පරිසරයට අදාළ නිපුණතා<br>. වැඩ ලෝකයට සූදානම් වීමේ නිපුණතා<br>. ආගම හා ආචාර ධර්මවලට අදාළ නිපුණතා<br>. ක්‍රීඩාව සහ විවේකය ප්‍රයෝජනයට ගැනීමේ නිපුණතා<br>. 'ඉගෙනීමට ඉගෙනුම' පිළිබඳ නිපුණතා | | මව්බස<br>දෙවන ජාතික භාෂාව<br>ගණිතය<br>ආගම<br>ක්‍රියාකාරකම් පාදක වාචික ඉංග්‍රීසි<br>පරිසරය ආශ්‍රිත ක්‍රියාකාරකම්<br>විෂය සමගාමී ක්‍රියාකාරකම් | | මව්බස<br>ඉංග්‍රීසි<br>දෙවන ජාතික භාෂාව<br>ගණිතය<br>ආගම<br>ක්‍රියාකාරකම් පාදක වාචික ඉංග්‍රීසි<br>පරිසරය ආශ්‍රිත ක්‍රියාකාරකම්<br>විෂය සමගාමී ක්‍රියාකාරකම් | | මව්බස<br>ඉංග්‍රීසි<br>දෙවන ජාතික භාෂාව<br>ගණිතය<br>ආගම<br>ක්‍රියාකාරකම් පාදක වාචික ඉංග්‍රීසි<br>පරිසරය ආශ්‍රිත ක්‍රියාකාරකම්<br>සිසු ලැදියා හා රුචිකත්ව සඳහා වන වෛකල්ප විෂයයන්<br>විෂය සමගාමී ක්‍රියාකාරකම් | |



# කාලය බෙදා ගැනීම

## පළමු වන ප්‍රධාන අවධිය (පළමු වන සහ දෙ වන ශ්‍රේණි)

| | විෂයය | සතියකට වෙන් කර ඇති කාලය |
|---|---|---|
| 1. | මවු බස | පැය 5.00 |
| 2. | ගණිතය | පැය 3.30 |
| 3. | පරිසරය ආශ්‍රිත ක්‍රියාකාරකම් | පැය 5.30 |
| 4. | ආගම | පැය 1.15 |
| 5. | දෙවන ජාතික භාෂාව | මිනිත්තු 30 |
| 6. | උදය රැස්වීම සහ ආගමික වතාවත් | පැය 1.15 (දිනකට මිනිත්තු 15 බැගින්) |
| 7. | විවේක කාලය | පැය 1.15 (දිනකට මිනිත්තු 15 බැගින්) |
| 8. | ආහාර ගැනීම සඳහා | මිනිත්තු 50 (දිනකට මිනිත්තු 10 බැගින්) |
| 9. | ශරීර සුවතා ක්‍රියාකාරකම් | පැය 1.40 (දිනකට මිනිත්තු 20 බැගින්) |
| 10. | විෂය සමගාමී ක්‍රියාකාරකම | මිනිත්තු 30 (සතියේ එක් දිනෙක) |
| | **සතියක මුළු කාලය** | **පැය 21.15** |

# ක්‍රිස්තියානි ධර්මය ගුරු මාර්ගෝපදේශය පරිශීලනය සඳහා උපදෙස්

කිතුනු දරුවකු ගේ ආගමික හැඟීම්වල හරය විය යුත්තේ, ඇදහිල්ල, ප්‍රීතිය හා ක්‍රිස්තුන් වහන්සේට අයත් වීම යි. සියලු යහපත් දේ දෙවි පියාණන් වහන්සේගෙන් ලැබෙන බව දැන ගැනීමෙන් ඇදහිල්ල හා ප්‍රීතිය ජනිත වෙයි. මෙහි දී නිරායාසයෙන් දෙවි පියාණන්ට ස්තුති කිරීමට හා යාච්ඤා කිරීමට යොමු විය යුතු ය. මෙම අරමුණු ප්‍රාථමික අධ්‍යාපන ක්‍රිස්තියානි විෂය නිර්දේශවල අන්තර්ගත වේ. මෙම අරමුණු කෙරෙහි මෙන් ම දේව නිර්මාණ වන අවට පරිසරය සුරැකීම, ආගමික වතාවත්වලට හුරු වීම සහ ආචාර ධර්ම ජීවිතවලට එකතු කර ගැනීම වැනි කරුණු කෙරෙහි ද අවධානය යොමු කරමින් මෙම විෂය නිර්දේශය සැකසී ඇත.

### ප්‍රාථමික අවධිය සඳහා වන නිපුණතා

1. දෙවි පියාණන් වහන්සේ දුන් දීමනා සහ ලෝකය හඳුනා ගනියි, අගය කරයි, රැක ගනියි.
2. දෙවි පියාණන් වහන්සේ ගේ ආදරය හා රැකවරණය අත්දකියි, ප්‍රතිප්‍රේමය දක්වයි.
3. දේව ප්‍රේමයට ප්‍රතිචාර දක්වමින් යහපත් කිතුනු ගුණාංග වඩවා ගනියි.
4. ජේසුස් වහන්සේ හඳුනා ගනියි, අනුගමනය කරයි.
5. ජේසුස් වහන්සේ ගේ ජීවිතයේ සුවිශේෂී වටිනාකම් හඳුනා ගනියි.
6. ශුද්ධාත්මයාණන් වහන්සේ හඳුනා ගනියි.
7. දේව රාජ්‍යයේ වටිනාකම් අනුව ක්‍රියා කරයි.
8. ශුද්ධ බයිබලයට අනුව දිවි ගෙවයි.

1 - 5 ශ්‍රේණි තෙක් ප්‍රාථමික අවධියේ ක්‍රිස්තියානි ධර්මය පිළිබඳ අත්දැකීම් ලබන සිසුන්, ප්‍රාථමික අවධිය අවසාන කරන විට උක්ත නිපුණතාවලට ළඟා වීම අපේක්ෂා කෙරේ. ඒ සඳහා අදාළ විෂය අන්තර්ගතය, විෂය නිර්දේශවල දක්වනු ලබන අතර ඊට අදාළ ව ක්‍රියාකාරකම් පාදක ප්‍රවේශයකින් කටයුතු කිරීම සඳහා යෝජනා කර ඇති ඉගෙනුම්-ඉගැන්වීම් ක්‍රමෝපාය වඩාත් නිර්මාණශීලී ව භාවිත කරනු ඇතැයි අපේක්ෂා කෙරේ. ක්‍රියාකාරකම් පාදක ඉගෙනුම් අත්දැකීම් ලබා ගැනීමේ දී ශ්‍රව්‍ය දෘශ්‍ය ආධාරකයක් ලෙස පමණක් පෙළ පොත යොදා ගැනීම සුදුසු ය.

### ඉගෙනුම් - ඉගැන්වීම් ක්‍රමවේදය

සැම ශිෂ්‍යයකු වෙනුවෙන් ම ක්‍රිස්තියානි ධර්මය පෙළ පොතක් නිකුත් කෙරේ. ගුරු මාර්ගෝපදේශයෙන් බොහෝ ක්‍රියාකාරකම් සඳහා මග පෙන්වීම් කෙරේ. එහි පහත දැක්වෙන ආකාරයේ ප්‍රාථමික සිසුන්ට යෝග්‍ය ඉගෙනුම්-ඉගැන්වීම් ක්‍රමෝපාය ඉදිරිපත් කර ඇත.

- පරිසරය හා සමඟ සම්බන්ධ වූ ප්‍රිය ජනක ක්‍රියාකාරකම් හා ක්‍රීඩා
- ආගමික වතාවත් හා සම්බන්ධ ක්‍රියාකාරකම්
- ගායන, රංගන, රූපණ, නිර්මාණ ආශ්‍රිත ක්‍රියාකාරකම්

### පාසල් ප්‍රතිපත්ති හා වැඩ සටහන්

පාසල් සංස්කෘතිය හා සම්බන්ධ වැඩසටහන්වලින් ක්‍රිස්තියානි ධර්මය විෂය සම්බන්ධ බොහෝ නිපුණතා ආවරණය කළ හැකි ය. එසේ ම තහවුරු කළ හැකි ය. තව ද පාසල් සංස්කෘතියෙහි මෙම නිපුණතා ගොඩනැගෙන නව අංග ඇති කිරීම කෙරෙහි ද විදුහල්පතිවරුන්ගේ සුවිශේෂ අවධානය යොමු කිරීම අපේක්ෂා කෙරේ.

ප්‍රාථමික පාසල සඳහා ක්‍රියාත්මක වන උදය ආගමික වැඩසටහන් මේ අතර ප්‍රධාන තැනක් ගනියි. පළමු වන ශ්‍රේණියේ දී ඉතා සරල ව අරඹා පස් වන ශ්‍රේණිය තෙක් මෙම වැඩසටහන ක්‍රමයෙන් දියුණු කරමින් විවිධ අංග එක් කළ හැකි ය.

පාසල අයත් මීසම/පළාත/දේවස්ථානය භාර දේවගැති තුමා/තුමිය හෝ ළඟ ම පිහිටි දෙව් මැඳුරක නැතහොත් ආයතනයක දේවගැති තුමා/තුමිය හෝ හමු වීමට සිසුන්ට අවස්ථාව සලසා දෙන අතර ම වාරයකට අවම වශයෙන් දෙවතාවක් වත් දෙව් මැඳුරට සිසුන් කැඳවා ගෙන යාමෙන් දෙව් පියාණන් වහන්සේගේ ආදර පහස විඳීමට ඔවුන්ට අවස්ථාව සැලසේ.

පවිත්‍රතාව, විනීත බව, සහයෝගය, ගුරුවරුන් කෙරෙහි පැවැත්විය යුතු ආචාර ධර්ම, ආශීර්වාද ඇසුරෙන් ගොඩ නැගෙන සමානාත්මතාව, සුහදතාවය, සහයෝගය ආදි ලක්ෂණවලින් පාසල් පරිසරය හා සම්බන්ධ සංස්කෘතිය අලංකාර වේ. ඉහත සංස්කෘතියෙහි ලා ක්‍රිස්තියානි ධර්මය විෂයයෙන් අපේක්ෂිත නිපුණතා වර්ධනය වන අවස්ථා උදා කළ හැකි ය. මෙ මඟින් විෂයයේ දී ඉගෙන ගන්නා සියල්ල ප්‍රායෝගික භාවිතයට ද අවස්ථා උදා වේ.

දින පතා පාසල ආරම්භ කිරීමේ දී හා අවසන් කිරීමේ දී කිතුනු දහමට අනුව සැකැසුණු පාසල් ප්‍රතිපත්තියක් කිතුනු පාසල්වල ක්‍රියාත්මක වේ. මේ හැර එම පාසල්වල විවිධ ආගමික උත්සව හා සම්බන්ධ වැඩසටහන් ද පවතී. එ බැවින් මෙ බඳු පාසල් ප්‍රතිපත්ති හා වැඩසටහන් පිළිබඳ ව ගුරුවරුන් මනා අවබෝධයක් ලබා ගත යුතු ය. එ බඳු වැඩසටහන්වල හා පාසල් ප්‍රතිපත්තිවල දරුවන් රඳවා ගනිමින් විෂය නිර්දේශ මඟින් අපේක්ෂිත නිපුණතා කරා ඔවුන් ළඟා කරවීමට නිරතුරු ව උනන්දු විය යුතු ය.

වෙනත් ආගමික බහුතරයක් සිටින පාසලක වුව ද යාච්ඤාවක් මඟින් හෝ තම ආගම සිහි කර ගැනීමේ අවස්ථාව සලසා දීමෙන් හෝ කිතුනු දරුවන් ගේ අයිතිවාසිකම් තහවුරු වේ.

## තක්සේරු කිරීම

ප්‍රාථමික ශ්‍රේණිවල දී ලිඛිත පරීක්ෂණ වැනි ඇගයීම්වලට වඩා ප්‍රමුඛත්වය දිය යුතු වන්නේ ප්‍රායෝගික ක්‍රියාකාරකම් ඇසුරු කර ගත් ඇගයීම්වලට ය. නිරීක්ෂණය, ගවේෂණය, ක්ෂේත්‍ර චාරිකා, අභිනය, නාට්‍ය, රූකඩ, සාකච්ඡා, වාචික ප්‍රශ්න වැනි ඇගයීම් මේ සඳහා උචිත වෙයි.

**ව්‍යාපෘති නායක**

# පටුන

පිටුව

| | |
|---|---|
| අධ්‍යක්ෂ ජනරාල්තුමාගේ පණිවිඩය | iii |
| නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල් හිමිගේ පණිවිඩය | iv |
| විෂයමාලා කමිටුව | v |
| හැඳින්වීම | vi |
| ජාතික අරමුණු | vii |
| මූලික නිපුණතා | viii - ix |
| විෂයමාලා සැලැස්ම | x |
| කාලය බෙදා ගැනීම | xi |
| ක්‍රිස්තියානි ධර්මය ගුරු මාර්ගෝපදේශය පරිශීලනය කිරීම සඳහා උපදෙස් | xii - xiii |
| පටුන | xiv |
| විෂය නිර්දේශය හා ඉගෙනුම් සැලැස්ම | xv |
| ඉගෙනුම් - ඉගැන්වීම ක්‍රියාවලිය | 1 |

# විෂය නිර්දේශය

# හා

# ඉගෙනුම් - ඉගැන්වීම් ක්‍රියාවලිය සඳහා

# උපදෙස්

# විෂය අරමුණු

1. සමාජයේ ගෞරවාදරයට බඳුන් වන කිතුනු ප්‍රතිපත්ති ඇති ඇදහිලිවන්ත දරුවකු බිහි කිරීම
2. ශුද්ධ බයිබලය යනු දේව වචනය බවට දැනුම්වත් කරමින් ශුද්ධ බයිබලයට අනුකූල ව ජීවත් වීමට දිරි ගැන්වීම
3. දෙවි පියාණන් වහන්සේ සමඟ ආත්මික සබඳතාවක් ගොඩනඟා ගැනීමට පුරුදු පුහුණු කිරීම
4. ජේසුස් වහන්සේ තම ජීවිතයේ ගැලවුම් කරුවාණන් බව පෙන්වා දීම
5. ශුද්ධාත්මයාණන් වහන්සේ ලෝකය තුළ වැඩ වෙසෙමින් නිරන්තරයෙන් තමාට මඟ පෙන්වතැයි යන විශ්වාසය ගොඩනැංවීම
6. ශුද්ධ බයිබලයෙන් හමු වන ශ්‍රේෂ්ඨ චරිතවල උදාර ගුණ ජීවිතයට උකහා ගැනීමට මඟ පෙන්වීම
7. දේව තිළිණයක් වූ පරිසරය ආරක්ෂා වන සේ ද, සකසුරුවම් ලෙස ද, පරිහරණය කරමින් තව දුරටත් සංවර්ධනය කර ගැනීමේ ආකල්ප ජනිත කිරීම
8. ස්වභාව ධර්මයෙන් හා තමා අවට ජීවත් වන අය ගෙන් දේව ආදරය අත් විඳීමට සහ ප්‍රතිප්‍රේමය දැක්වීමට අවස්ථා සම්පාදනය කිරීම
9. සියල්ලන්ට ම ප්‍රේම කරමින් කණ්ඩායමක් තුළ එකමුතු ව සමගියෙන් කටයුතු කිරීමේ කුසලතා රෝපණය කිරීම
10. අන්‍යාගම්වලට ද ගරු කරමින් සාමයෙන් හා සහයෝගිතාවෙන් යුතු ව ජීවත් වීමේ වැදගත් ගුණාංග වර්ධනය කිරීම

| තේමාව | නිපුණතාව | විෂය අන්තර්ගතය |
| --- | --- | --- |
| 1.0 දෙවි පියාණන් වහන්සේ දුන් දීමනා | 1.0 දෙවි පියාණන් වහන්සේ දුන් දීමනා සහ ලෝකය හඳුනා ගනියි. අගය කරයි. රැක ගනියි. | 1.1 මල්, පලතුරු, තුරුලතා, ජලය (උත්පත්ති 1 : 9 - 10) (ගීතාවලිය 104 : 6 - 16) |
| | | 1.2 දෙවිඳුන්ගේ මනහර නිර්මාණ වූ කුරුල්ලෝ, මාළුවෝ හා සියලු වර්ගවල සත්තු (උත්පත්ති 1 : 20, 22 - 25) ගීතාවලිය 104 : 17) |
| 2.0 දෙවි පියාණන් වහන්සේ ගේ ආදරය හා රැකවරණය | 2.0 දෙවි පියාණන් වහන්සේ ගේ ආදරය හා රැකවරණය අත්දකියි. ප්‍රතිප්‍රේමය දක්වයි. | 2.1 නිවසේ පවුල (ලූක් 2 - 51 - 52) |
| | | 2.2 දේවස්ථානයේ පවුල (ක්‍රියා 2 : 46 - 47) |
| | | 2.3 සමාජීය පවුල (මතෙව් 25 : 35 - 36) |
| 3.0 දේව ප්‍රේමයට ප්‍රතිචාර දැක්වීම සඳහා දේව ගුණාංග ඇති කර ගැනීම | 3.0 දේව ප්‍රේමයට ප්‍රතිචාර දක්වමින් යහපත් කිතුනු ගුණාංග වඩවා ගනියි. | 3.1 යහපත් කිතුනු ලක්ෂණ හා වටිනාකම් (රෝම 12 : 10 - 13) |
| 4.0 ජේසුස් වහන්සේ හඳුනා ගැනීම | 4.0 ජේසුස් වහන්සේ හඳුනා ගනියි. අනුගමනය කරයි. | 4.1 දේව මාලිගයේ දී පඬිවරුන්ට සවන් දීම හා ප්‍රශ්න විචාරීම (ලූක් 2 : 46 - 47) |
| | | 4.2 ජේසුස් වහන්සේ බව්තීස්මය ලැබීම (මාර්ක් 1 : 9 - 11) |
| | | 4.3 මවට සවන් දීම හා යහපත් ප්‍රතිචාර දැක්වීම. (ජොහන් 2 : 1 - 12) |
| 5.0 ජේසුස් වහන්සේ ගේ ජීවිතයේ සුවිශේෂ වටිනාකම් හඳුනා ගැනීම | 5.0 ජේසුස් වහන්සේ ගේ ජීවිතයේ සුවිශේෂ වටිනාකම් හඳුනා ගනියි. | 5.1 දෙවි පියාණන් වහන්සේ සියල්ල සපයා දෙන බව (මතෙව් 6 : 25 - 28) |
| | | 5.2 සැම කෙනෙකු තුළ ම වටිනාකමක් ඇති බව ගේ කුරුල්ලන් පිළිබඳ ඉගැන්වීම (මතෙව් 10 : 29- 31) |
| | | 5.3 ජේසුස් වහන්සේ ඉගැන්වූ යාච්ඤාව (මතෙව් 6 : 9 - 13) |

| තේමාව | නිපුණතාව | විෂය අන්තර්ගතය |
|---|---|---|
| **6.0 ශුද්ධාත්මයාණන් වහන්සේ හඳුනා ගැනීම** | 6.0 ශුද්ධාත්මයාණන් වහන්සේ හඳුනා ගනියි. | 6.1 ප්‍රේමය, ප්‍රීතිය, සාමය (ශුද්ධාත්ම ඵල)<br>(ගලාති 5 : 22) |
| **7.0 දේව රාජ්‍යයේ වටිනාකම් අනුව ක්‍රියා කිරීම** | 7.0 දේව රාජ්‍යයේ වටිනාකම් අනුව ක්‍රියා කරයි. | 7.1 සහෝදර බැඳීමෙන් ක්‍රියා කිරීම.<br>ඒසව් හා ජාකොබ් සමඟි වීම<br>(උත්පත්ති 33 : 3 - 11) |
| | | 7.2 මිත්‍රත්වයෙන් ක්‍රියා කිරීම<br>දාවිත් හා ජොනතන් අතර මිත්‍රත්වය<br>(1 සාමුවෙල් 20 : 41B - 42) |
| | | 7.3 කරුණාවෙන් සමාජය තුළ ක්‍රියා කිරීම<br>(2 සාමුවෙල් 9 : 1 - 13) |
| | | 7.4 දේව වචනයට අනුව ක්‍රියා කිරීම<br>(ලූක් 8 : 4 - 8) |
| **8.0 ශුද්ධ බයිබලය ජීවිතයට අදාළ කර ගැනීම** | 8.0 ශුද්ධ බයිබලයට අනුව දිවි ගෙවයි. | 8.1 රජ කුමරියකගේ රැකවරණය ලද මෝසෙස්<br>(නික්මයාම 2 : 1 - 10) |
| | | 8.2 නැති වූ පුත්‍රයාගේ උපමා කතාව<br>(ලූක් 15 : 11 - 24) |
| | | 8.3 අත්තිවාරම් දෙක පිළිබඳ ඉගැන්වීම<br>(මතෙව් 7 : 24 - 27) |

# ක්‍රිස්තියානි ධර්මය

## ගුරු මාර්ගෝපදේශය

### දෙවන ශ්‍රේණිය

(2017 වර්ෂයේ සිට ක්‍රියාත්මක වේ.)

මුල් ළමාවිය සංවර්ධන හා ප්‍රාථමික අධ්‍යාපන දෙපාර්තමේන්තුව
ජාතික අධ්‍යාපන ආයතනය
මහරගම
ශ්‍රී ලංකාව

විද්‍යුත් තැපෑල : info@nie.lk
වෙබ් අඩවිය : www.nie.lk

# 1.0 තේමාව : දෙවි පියාණන් වහන්සේ දුන් දීමනා

**නිපුණතාව** : **දෙවි පියාණන් වහන්සේ දුන් දීමනා සහ ලෝකය හඳුනා ගනියි. අගය කරයි. රැක ගනියි.**

**ඉගෙනුම් පල** : 1.1

- මල්, පලතුරු, තුරුලතා හා ජලය දෙවියන් වහන්සේගේ අගනා නිර්මාණ ලෙස හඳුනා ගනිමින් එකමුතුව සෙල්ලම් නිවසේ ප්‍රීතියෙන් ගීතයක් ගායනා කරයි.

**ඉගෙනුම් සම්පත්** :
- ශුද්ධ බයිබලය (උත්පත්ති 1 : 9 - 10), (ගීතාවලිය 104 : 6 - 16)
- මල්, පලතුරු
- ගීතිකාවක්

## ඉගෙනුම් - ඉගැන්වීම් ක්‍රමෝපාය

### දෙවිඳුන් දුන් දීමනා

පියවර 1 :
- පෙර දැනුම් දීමෙන් ගෙනා, දෙවියන් වහන්සේගේ නිර්මාණ වන මල් හා පලතුරු පන්තිය ඉදිරියට ගෙන ගොස් පෙන්වීමට සලස්වන්න.
- පන්තිය ඉදිරියේ ඒවායේ අලංකාරය, රස සහ ගුණ අගය කිරීමට ඉඩ දෙන්න.
- අපගේ යහපත සඳහා දෙවිඳුන් දුන් මල්, පලතුරු, තුරුලතා වර්ධනය කිරීමට ජලය අවශ්‍ය බව පැහැදිලි කරන්න.

පියවර 2 :
- ශුද්ධ බයිබලයේ අදාළ කොටස් පන්තියේ ළමයින්ට ඇසෙන සේ කියවන්න. (උත්පත්ති 1 : 9 - 10 සහ ගීතාවලිය 104 : 6 - 16)
- පහත කරුණු ඉස්මතු කර දක්වන්න.

  උත්පත්ති - දෙවන දවසෙහි දෙවියන් වහන්සේ ගොඩබිම හා සාගරය මැවූ බවත්, ගොඩබිමට පොළොව කියා ද, ජලයට සාගරය කියා ද නම් කළ බවත්,

  ගීතාවලිය - දෙවියන් වහන්සේ කඳු හෙල් මැවූ බව,<br>පිපාසය සංසිඳවීමට ජලය මැවූ බව,<br>උල්පත් මවා සියලු සතුන්ට ජලය පානය කිරීමට සැලසූ බව,<br>උන් වහන්සේ මැවූ ජලයෙන් සියලු පොළොව සාරවත් කළ බව

- දෙවියන් වහන්සේ මවා ඇති මල් වර්ගවල හා පලතුරු වර්ගවල නම් එකිනෙකා ගෙන් විමසන්න. ඒවා දුන් දෙවිඳුන්ට ස්තුති දී යාච්ඤාවක් කරන්න.

පියවර 3 :
- ළමයින් සෙල්ලම් ගෙය වෙත ගෙන යන්න.
- දෙවිඳුන් මැවූ මල් වර්ග අතට දී ඒවායින් සෙල්ලම් ගෙය සරසවන්න.
- උන් වහන්සේ මැවූ රසවත් පලතුරු බෙදා දී ඒවා භුක්ති විඳීමට සලස්වන්න.
- පහත සඳහන් කෙටි ගීතිකාව 'ගුමු ගුමු නද දීලා' යන ගීතයේ තාලයට ළමයින් සමඟ ගායනා කරන්න.

  වැසි වැස දිය පිරිලා<br>මුළු බිම සරු වීලා<br>දෙවිඳු මැවූ පල සම්පත් පස ගැන<br>තුති දෙමු දෙවිඳුන්ටා

ගස්වල මල් පිපිලා
අතු අග ගෙඩි හැදිලා
දෙවිඳු මැවූ මේ මැවිලි සැමා ගැන
තුති දෙමු දෙවිඳුන්ටා

**තක්සේරුව :**

- ළමයින් සෙල්ලම් ගෙදරට ගෙන ගොස් ඔවුන් ගෙනා මල්වලින් සෙල්ලම් ගෙය අලංකාර කර, දෙවිඳුන් මැවූ පලතුරු භුක්ති විඳිමින් ප්‍රීතියෙන් ගීතයක් ගයයි.

**ප්‍රායෝගික ජීවිතයේ භාවිතය සඳහා**

- නිවසේ තිබෙන මල්, පලතුරු ගස්වලට වතුර යොදා ඒවා රැක බලා ගැනීමට වැඩිහිටියන්ට උපකාර කරමින් දේව මැවිල්ල ගැන ස්තුති කිරීම.

## 1.0 තේමාව : දෙවි පියාණන් වහන්සේ දුන් දීමනා

**නිපුණතාව** : **දෙවි පියාණන් වහන්සේ දුන් දීමනා සහ ලෝකය හඳුනා ගනියි. අගය කරයි. රැක ගනියි.**

**ඉගෙනුම් පල** : 1.2

- විවිධ සතුන් මැවූ දෙවියන් වහන්සේ පසසමින් ක්ලේ යොදා ගනිමින් සතුන් සතුටින් අඹයි.

**ඉගෙනුම් සම්පත්** :

- ශුද්ධ බයිබලය (උත්පත්ති 1 : 20, 22 - 25)
- විවිධ සතුන්ගේ පින්තූර
- ඇඹීම සඳහා ක්ලේ

### ඉගෙනුම් - ඉගැන්වීම් ක්‍රමෝපාය

**දෙවිඳුන් දුන් දීමනා**

පියවර 1 :
- උත්පත්ති 1 : 20 හා 22 - 25 කොටස් සිසුන්ට ඇසෙන සේ කියවන්න.
- කලින් සූදානම් කරන ලද දෙවිඳුන් මැවූ විවිධ සතුන් වර්ග ඉරටු මත රඳවා දරුවන් අතට ලබා දී එම සතුන් හඳුනා ගැනීමට අවස්ථාව ලබා දෙන්න.

පියවර 2 :
- එම සතුන්ට දෙවිඳුන් දුන් විශේෂ හැකියා, එනම් ගමන් විලාසය, විවිධ ශබ්ද කිරීමේ හැකියාව ආදිය ළමයින්ට පන්තියේ ඉදිරිපත් කිරීමට සලස්වන්න.

පියවර 3 :
- දෙවිඳුන් මෙම සතුන්ට දුන් විවිධ දක්‍ෂතාවන් ගැන හා එම සතුන් ගැන විමසීමක් කරන්න.
  *උදා* : * රාජාලියාට කුරුල්ලන් අතරින් ඉහළට ම පියාඹා යෑමට දී ඇති හැකියාව
  * හාල්මැස්සා ඉතා ම කුඩා මත්ස්‍යයා බව

පියවර 4 :
- මුද්‍රණය කර සූදානම් කර ගත් දෙවියන් වහන්සේ මැවූ විවිධ සතුන්ගේ රූප දරුවන් අතට ලබා දී කැමති අයුරින් පාට කිරීමට උපදෙස් දෙන්න. (පූසා, රාජාලියා, හාල්මැස්සා, ඉබ්බා)
- ඒවා ඇගයීමකට ලක් කරන්න.
- සියලු චිත්‍ර එකතු කර ඒවා පන්තියේ ප්‍රදර්ශනය කිරීමට සලස්වන්න.
- දෙවියන් වහන්සේ විවිධ සතුන් මැවූ බව විශ්වාස කරමින් දෙවිඳුන් හට ස්තුති දී යාච්ඤාවක් පුද කරන්න.

**තක්සේරුව :**

- ක්ලේ යොදා ගනිමින් දෙවියන් වහන්සේ මැවූ තමන් කැමති සතකු අඹයි.

**ප්‍රායෝගික ජීවිතයේ භාවිතය සඳහා**

- සුරතල් සතුන් රැක බලා ගැනීම

## 2.0 තේමාව : දෙව් පියාණන් වහන්සේගේ ආදරය හා රැකවරණය

**නිපුණතාව** : දෙව් පියාණන් වහන්සේගේ ආදරය හා රැකවරණය අත්දකියි. ප්‍රතිප්‍රේමය දක්වයි.

**ඉගෙනුම් පල** : 2.1

- දේව ප්‍රේමය
  - * නිවසේ පවුල තුළ දෙවියන් වහන්සේගේ ආදරය හ රැකවරණය අත්දකිමින් ඒ පිළිබඳ ව තුති පුදමින් යාච්ඤා කරයි.
  - * දෙමාපියන්ගේ යහපත් ඉල්ලීම්වලට කීකරු වෙමින් ඔවුන්ට උපකාර කරන ආකාරය ගායනයෙන් ප්‍රකාශ කරයි.

**ඉගෙනුම් සම්පත්** :
- ශුද්ධ බයිබලය (ලූක් 2 : 51 - 52)
- ජේසුස් වහන්සේ වඩු මඩුවෙහි තම පියාට උපකාර කරන වර්ණවත් පින්තූරයක්
- ගීතිකාවක්

## ඉගෙනුම් - ඉගැන්වීම් ක්‍රමෝපාය

### නිවසේ පවුල

පියවර 1 :
- පෙර සූදානම් කරගෙන තිබූ ඉරට්ටේ ගසන ලද රූකඩ මඟින් කථාවක් ගොඩනඟයි.

**අම්මා** : පුතා අද තමයි ආච්චි, නැන්දලාගේ ගෙදර ඉඳන් අපේ ගෙදර එන දවස

**පුතා** : ආ . . . අද නම් හරි ම සතුටු දවසක්

**දුව** : අම්මේ අපි එහෙනම් ආච්චිට ඉන්න අපේ කාමරය ලෑස්ති කරන්නම්.

**අම්මා** :: ඒක හොඳ වැඩක්

**තාත්තා** : ගිහින් බලන්නකෝ. දුවයි, පුතයි මහන්සි වෙනවා, ආච්චිගේ කාමරය පිළියෙළ කරන්න.

**පුතා** : මම හොඳට කාමරය අතුගෑවා

**දුව** : ඇයි මම ලස්සණට ඇඳ ඇතිරිලි දැම්මා

**අම්මා** : හරි ම ලස්සණයි ඔය දෙන්නා පිළියෙළ කළ කාමරය. ඔයාලා දන්නවා ද ආච්චි කැමති ම කෑම ?

**පුතා** : ඔව් අම්මේ. වැලිතලප නේ ද ?

**අම්මා** : හරියට හරි. අපි ඒවාත් හදලා ආච්චි සන්තෝෂ කරමු.

**දුව** : දැන් ඔක්කෝම ලෑස්තියි. ආච්චි එනකම් සතුටින් මඟ බලාගෙන ඉඳිමු.

පියවර 2 :
- ජේසුස් වහන්සේ තම පියාට වඩු මඩුවෙහි උපකාර කරන පින්තූරයක් පෙන්වා ඒ ගැන සාකච්ඡා කරන්න.

පියවර 3 :
- නිවසේ දී දරුවන් දෙමවුපියන්ට කීකරු වූ හා උපකාර කළ අවස්ථා පැවසීමට අවස්ථාව දෙන්න.
- දෙවිඳුන් දුන් ආදරය හා රැකවරණය අත්දුටු අවස්ථා පිළිබඳ ව ස්තුති කරමින් යාච්ඤාවක යෙදෙන්නට සලස්වන්න.

**පියවර 4 :** • පහත සඳහන් ගීතය ගායනා කරන්න.

පුංචි ළමයි අප සැමා ජේසුගේ දරුවෝ
එතුමා කැමති විලසිනා හැඩ ගැසෙමු සදා
අම්මටයි, තාත්තටයි කීකරු වීලා
ආච්චිවත්, සීයවත් හොඳින් රැක ගමු

(රන් දොරින් ඇතුල් වෙලා යන ගීතිකාවේ තනුව යොදා ගන්න.)

**පියවර 5 :** • සියලු දරුවන්ට ඇසෙන සේ බයිබල් පාඨය කියවන්න. (ලූක් 2 : 51, 52)

• පහත සඳහන් දෑ ඉස්මතු කරන්න.

* ජේසුස් වහන්සේ දෙමවුපියන්ට කීකරු ව සිටි බව,
* ජේසුස් වහන්සේ ප්‍රඥා මහිමයෙන් හා කාය ශක්තියෙන් දෙවියන් වහන්සේගේ හා මිනිසුන්ගේ ප්‍රසාදය ලබමින් වැඩුණු බව

**තක්සේරුව :**

• පෙර ඉගෙන ගත්තා වූ ගීතය අංග චලන යොදාගෙන ඉදිරිපත් කරයි.

**ප්‍රායෝගික ජීවිතයේ භාවිතය සඳහා**

• තමා ආදරයෙන් සුරැකීම සඳහා පවුලේ අය ලබා දුන් දෙවියන් වහන්සේට ස්තුති කිරීමට යොමු කිරීම.

## 2.0 තේමාව : දෙවි පියාණන් වහන්සේගේ ආදරය හා රැකවරණය

**නිපුණතාව** : දෙවි පියාණන් වහන්සේගේ ආදරය හා රැකවරණය අත්දකියි. ප්‍රතිප්‍රේමය දක්වයි.

**ඉගෙනුම් පල** : 2.2

- දෙවි මැඳුරේ එකතු වන පවුල මඟින් දෙවියන් වහන්සේගේ ආදරය හා රැකවරණය අත්විඳ ඇති අවස්ථා ඉදිරිපත් කරයි.
- දේව ප්‍රේමයට ප්‍රතිප්‍රේමය දැක්වීමක් වශයෙන් දෙවි මැඳුරේ දී එකතු වන සභා පවුල දැක්වෙන චිත්‍රයක් නිර්මාණය කරයි.

**ඉගෙනුම් සම්පත්** :
- ශුද්ධ බයිබලය (ක්‍රියා 2 : 46 - 47)
- දේවස්ථානයේ දේව නමස්කාරයට සහභාගි වන සමූහය දැක්වෙන පින්තූරයක්
- දේව මාලිගාවේ ආකෘතිය දැක්වෙන $A_4$ පිටපත්

### ඉගෙනුම් - ඉගැන්වීම් ක්‍රමෝපාය

**නිවසේ පවුල**

පියවර 1 :
- දෙවියන් වහන්සේට නමස්කාර කිරීමට දේවස්ථානයට සහභාගි වන සමූහයාගේ පින්තූරයක් පෙන්වීම.
- දේවස්ථානය හා එහි කරන කටයුතු පිළිබඳ ව ළමයින්ගෙන් විමසන්න.
- දේවස්ථානය අපගේ ජීවිතයේ වැදගත් තැනක් ගන්නා බව ළමයින්ට පැහැදිලි කරන්න.
- දේවස්ථානයට අයත් සියලු දෙනා ම සැම ඉරු දිනක ම දේව නමස්කාරයට සහභාගි වීම ඉතා වැදගත් බව ළමයින්ට අවධාරණය කරන්න.

පියවර 2 :
- ඉරු දිනක දෙමාපියන්ට දේවස්ථානයට ඒමට නොහැකි වූ විට, වෙනත් පවුලක් ඔවුන් ගේ දරුවා දේවස්ථානයට ගෙන ආ අයුරුත්, එහි දී අන් අය ආදරයෙන් ඔහු රැකගනිමින් ඔහුට උපකාර කොට දේවස්ථානයේ දී ආදරය හා රැකවරණය අත්දැකීමට සලස්වා නැවත ගෙදරට ඇරලූ ආකාරයත් පිළිබඳ අත්දැකීමක් කලින් සූදානම් කර ගත් සිසුවකු මඟින් බෙදා ගැනීමට සලස්වන්න.

පියවර 3 :
- එම සිදුවීම ආශ්‍රයයෙන් දෙවි මැඳුරේ දී එකතු වන සභා පවුල මඟින් දෙවියන් වහන්සේගේ ආදරය හා රැකවරණය අත් විඳි අවස්ථා පිළිබඳ ව සියලු සිසුන්ගෙන් විමසන්න.

  *උදා* : එකමුතු ව ගීතිකා ගායනය
  * දෙවියන් වහන්සේගෙන් ලැබූ ආශීර්වාද බෙදා හදා ගැනීම
  * දේවගැති තුමා/තුමිය දේව වචනය පහදා දීම මඟින් දේව රැකවරණය තහවුරු කිරීම

පියවර 4 :
- සියලු සිසුන්ට ඇසෙන සේ ශුද්ධ බයිබලය (ක්‍රියා 2 : 46 - 47) කියවන්න. පහත සඳහන් කරුණු ඉස්මතු කරන්න.
  * ඔවුන් එකමුතු ව දේව මාලිගාවට රැස් වූ බව,
  * ගෙයින් ගෙට ගොස් ආහාර කඩමින් ද, ප්‍රීතියෙන් හා ත්‍යාගිවන්ත සිතින් ඒවා බෙදා ගත් බව,
  * දෙවියන් වහන්සේට ප්‍රශංසා කිරීමෙන් සියල්ලන්ගේ ප්‍රසාදය ලද බව
- දෙවි මැඳුරේ ආකෘතියක පින්තූරයක් පැනල් පුවරුවේ අලවන්න. එහි දේව වචනයට සවන් දීමට ආ සමූහයා, එක් එක් ළමයාට ඇලවීමට සලස්වන්න.

**තක්සේරුව :**

- දේවස්ථානයේ ආකෘතියක සමූහයාගේ පින්තූර ඇඳ සම්පූර්ණ කරයි.

**ප්‍රායෝගික ජීවිතයේ භාවිතය සඳහා**

- සැම ඉරු දිනක ම දෙමවුපියන්/භාරකරුවන් සමඟ දේවස්ථානයට ගොස් දෙවියන් වහන්සේට නමස්කාර කිරීමට යොමු වීම.

## 2.0 තේමාව : දෙවි පියාණන් වහන්සේගේ ආදරය හා රැකවරණය

**නිපුණතාව** : **දෙවි පියාණන් වහන්සේගේ ආදරය හා රැකවරණය අත්දකියි, ප්‍රතිප්‍රේමය දක්වයි.**

**ඉගෙනුම් පල** : 2.3

- සමාජයේ පවුල හරහා දෙවියන් වහන්සේගේ ආදරය හා රැකවරණය අත් දකින අයුරු චිත්‍රයට නගයි.
- දේව ප්‍රේමයට ප්‍රතිප්‍රේමය දැක්වීමක් වශයෙන් සමාජයේ සිටින දුගී පුද්ගලයකුට උපකාර කරයි.

**ඉගෙනුම් සම්පත්** :

- ශුද්ධ බයිබලය (මතෙව් 25 : 35, 36)
- කාඩ්බෝඩ්වල අලවා ගත් විවිධ වයස්වලට අයත් පුද්ගලයන්ගේ රූප
- වහලක් සෑදීමට උපකාර කරන දේවස්ථානයේ තරුණ කණ්ඩායමක් දැක්වෙන පින්තූරයක පිටපත්

### ඉගෙනුම් - ඉගැන්වීම් ක්‍රමෝපාය

**සමාජීය පවුල**

පියවර 1 :
- විවිධ ගැහැනු, පිරිමි වශයෙන් වැඩිහිටි, තරුණ, බාල සැමගේ බොහෝ පින්තූර මේසය මත තබන්න.
- එක් දරුවකු කැඳවා ඉන් කැමති රූප ගෙන තම පවුලේ සාමාජිකයන් වශයෙන් පැනල් පුවරුවේ රඳවන්න අවස්ථාව දෙන්න.
- තව දරුවකුට තමාගේ මාමාගේ පවුලේ සිටින සාමාජිකයන් පැනල් පුවරුව මත රඳවන්න සලස්වන්න.
- තවත් දරුවකු කැඳවා තම නැන්දාගේ පවුලේ සාමාජිකයන් තෝරා පුවරුව මත රඳවන්න සලස්වන්න.
- තව එක් දරුවකුට තම නිවසේ අසල්වැසි පවුලේ සාමාජිකයන් තෝරා පැනල් පුවරුවේ රඳවන්නට සලස්වන්න.

පියවර 2 :
- ඉහත සඳහන් සියලු කණ්ඩායම් එකතු වූ විට එනම් ගෙදර අය, නෑදෑයින්, වටපිටාවේ අය, දේවස්ථානයේ අය සියලු දෙනා එකතු වූ විට සමාජය සෑදෙන බව පෙන්වා දෙන්න.

පියවර 3 :
- සමාජය සෑදීමට එකතු වූ මේ සියලු දෙනා ම දෙවිඳුන් දුන් වටිනා සම්පත් බව පහදන්න.
- එලෙස ම අන්‍යෝන්‍ය උපකාර සමාජය තුළ පැවතිය යුතු බව දරුවාට ඒත්තු ගන්වන්න.
- සමාජයේ අන් අය මඟින් සිසුන්ට ආදරය හා රැකවරණය ලැබීම අත්දුටු අවස්ථා පිළිබඳ සාකච්ඡාවක් මෙහෙයවන්න.

  *උදා* : * අම්මා ගෙදර නැති විට අසල්වැසි ගෙදර නැන්දා තමා රැක බලාගෙන පෝෂණය කළ අයුරු

  : මාමා තමා ආරක්ෂිත ව ඉරුදින පාසලට ඇරලවූ අයුරු ආදි අවස්ථා ගෙන හැර දක්වන්න.
- සියලු ළමයින් හට අන්‍යයන්ට උපකාර කරන පින්තූරයක් ලබා දී එය වර්ණ ගැන්වීමට සලස්වන්න.

**පියවර 4 :** • සියලු දරුවන්ට ඇසෙන සේ ශුද්ධ බයිබලයේ පාඨය කියවන්න. (මතෙව් 25 : 35, 36)

• පහත සඳහන් කරුණු ඉස්මතු කරන්න.

* කෑම නැති අයට කෑම ලබා දීම.

* පිපාසය ඇති අයට බොන්නට දීම.

* වස්ත්‍ර නැති අයට ඇඳුම් දීම.

* කොන් වී සිටින අය පිළිගැනීම.

* රෝගාතුරයන් බැලීමට යාම.

(කිතුනුවන් ලෙස අප මේවා කිරීම දේව කැමැත්ත බව පවසන්න.)

**තක්සේරුව :**

- අන්‍යෝන්‍ය උපකාරය පිළිබිඹු වන අවස්ථාවක පින්තූරයක් වර්ණ ගන්වයි.

**ප්‍රායෝගික ජීවිතයේ භාවිතය සඳහා**

- සමාජයේ සිටින අවශ්‍යතා ඇති අයට උපකාර කිරීම.

## 3.0 තේමාව : දේව ප්‍රේමයට ප්‍රතිචාර දැක්වීම සඳහා දේව ගුණාංග ඇති කර ගැනීම

**නිපුණතාව** : දේව ප්‍රේමයට ප්‍රතිචාර දක්වමින් යහපත් කිතුනු ගුණාංග වඩවා ගනියි.

**ඉගෙනුම් පල** : 3.1

- ආදර්ශවත් කිතුනු දරුවකු ලෙස යහපත් කටයුතුවල නිරත වෙමින් දේව ප්‍රේමයට ප්‍රතිචාර දක්වයි.

**ඉගෙනුම් සම්පත්** :
- ශුද්ධ බයිබලය (රෝම 12:10 - 13)
- බ්‍රිස්ටල් බෝඩ් 6" 3" කාඩ්පත්, කළුලෑල්ල, හුනුකූරු
- කෝටුවක් 7", වැලි දමන ලද ටින් එකක්

### ඉගෙනුම් - ඉගැන්වීම් ක්‍රමෝපාය

පියවර 1 : • දේව ප්‍රේමයේ ගුණාංග කියැවෙන ප්‍රශංසාත්මක ගීතයක් ගායනා කිරීම.

ඉවසිලිවන්ත ය, කරුණාවන්ත ය
ප්‍රේමයේ හැටි එය වේ
ක්‍රෝධය මානය වෛරය
නොමැති ද ප්‍රේමය
එතැන රැඳේ

විනීත වේ උඩඟු නොවේ
සිතේ නපුර නොමැතේ
අන් වරදේ සතුටු නොවේ
හරි දේ ගැන තුටු වේ

ඉවසිලිවන්ත ය කරුණාවන්ත ය
ප්‍රේමයේ . . .

පියවර 2 : • රෝම 12:10-13 සිසුන්ට ඇසෙන පරිදි කියවන්න. එම කොටසෙන් කියවෙන කිතුනු දරුවකු තුළ තිබිය යුතු ගුණාංග කළුලෑල්ලේ ලියා දක්වන්න. (ක්‍රිස්තියානි ජීවිත ප්‍රතිපත්ති)

* සුහද සහෝදර ප්‍රේමයෙන් සිටින්න.
* තමාට වඩා අන් අය උතුම් කොට සලකන්න.
* කාර්යශීලී වන්න.
* බලාපොරොත්තුවෙහි ප්‍රීති වන්න.
* නොකඩවා යාච්ඤාවේ යෙදෙන්න.
* සැම දෙනාට ම උපකාර කරන්න.

ආදි ගුණාංග කෙටියෙන් පැහැදිලි කරන්න.

**පියවර 3 :**
- බ්‍රිස්ටල් බෝඩ් කාඩ්පත් සිසුන්ට බෙදා දෙන්න. එහි කිතුනු දරුවකු ලෙස දේව ප්‍රේමයෙන් ඉටු කරන කාර්ය චිත්‍රයට නැඟීමට සලස්වන්න. යැයි උපදෙස් දෙන්න.
- පසුව එය කොටුව මත රැඳවීමට සලස්වන්න.
- ඉන් පසු එය වැලි දමන ලද ටින් බඳුනේ රැඳවීමට අවකාශ ලබාදෙන්න.

**තක්සේරුව :**

- කිතුනු දරුවකු ලෙස දේව ප්‍රේමයෙන් ඉටු කරන කාර්ය චිත්‍රයට නැඟීම

**ප්‍රායෝගික ජීවිතයේ භාවිතය සඳහා**

- දින පතා යහපත් කටයුතුවල නිරත වීම

## 4.0 තේමාව : ජේසුස් වහන්සේ හඳුනා ගැනීම

**නිපුණතාව** : **ජේසුස් වහන්සේ හඳුනා ගනියි. අනුගමනය කරයි.**

**ඉගෙනුම් පල** : 4.1

- ජේසුස් වහන්සේ ජෙරුසලමේ දේව මාලිගයේ දී පඬිවරුන්ට සවන් දෙමින් හා ප්‍රශ්න විචාරමින් සිටි සිදුවීම ඇසුරෙන් කෙටි ප්‍රශ්න කිහිපයකට වාචික පිළිතුරු සපයයි.

**ඉගෙනුම් සම්පත්** :

- ශුද්ධ බයිබලය (ලූක් 2 ඃ 46 - 47)
- ජේසුස් වහන්සේ ජෙරුසලම් දේව මාලිගයේ පඬිවරුන් මැද කතා බහේ යෙදී සිටින ආකාරය දක්වෙන වර්ණවත් පින්තූරයක්
- අදාළ බයිබල් කොටස ආශ්‍රිත ව වාචික ප්‍රශ්න කිහිපයක් (ගුරුතුමිය සූදානම් කරගෙන ඒම අපේක්ෂිත ය.)

### ඉගෙනුම් - ඉගැන්වීම් ක්‍රමෝපාය

පියවර 1 ඃ

- පාසල් වත්තේ සුදුසු ස්ථානයකට සිසුන් රැගෙන යන්න.
- පහසු ලෙස වාඩි වන්නට සලස්වන්න.
- ලූක් 2 ඃ 46 - 47 බයිබල් කොටස සිසුන්ට ඇසෙන පරිදි කියවන්න.

පියවර 2 ඃ

- ජේසුස් වහන්සේ දේව මාලිගයේ පඬිවරුන් මැද ප්‍රශ්න අසමින් හා පිළිතුරු දෙමින් සිටින වර්ණවත් චිත්‍රය ප්‍රදර්ශනය කරන්න.
- චිත්‍රය පිළිබඳ ව සිසුන්ට අදහස් දැක්වීමට අවස්ථාව ලබා දෙන්න.
- බයිබල් කොටස නැවත මතකයට නංවමින් ජේසුස් වහන්සේ වයස අවුරුදු 12 දී දෙමාපියන් සමඟ ජෙරුසලම් දේව මාලිගයට යෑම හා එහි දී සිදු වූ සිදුවීම සිසුන් සමඟ සාකච්ඡා කරන්න.

පියවර 3 ඃ

- ජේසුස් වහන්සේ කුඩා අවධියේ සිට ම දෙවි පියාණන් ගැන ඉගෙන ගන්නට උනන්දු බවත්, එතුමන්ගේ බුද්ධි මහිමය දුටු අය පුදුමයට පත් වූ බවත් කියා දෙන්න.
- ඉරුදින පාසලට යන සිසුන් පිළිබඳ ව විමසන්න. ඉරුදින පාසල් යන සිසුන් අගය කරන්න. සෑම සිසුවකුම ඉරුදින පාසල් යෑම අවශ්‍ය බව අවධාරණය කරන්න.

පියවර 4 ඃ

- ලූක් 2 ඃ 46-47 බයිබල් කොටසින් ප්‍රශ්න කිහිපයක් ඉදිරිපත් කර වාචික ව පිළිතුරු ලබ ගන්න.
- අදාළ කෙටි ප්‍රශ්න
  - * ජේසුස් වහන්සේ සිටියේ කුමන ස්ථානයක ද ?
  - * ජේසුස් වහන්සේ සිටියේ කා සමඟ ද ?
  - * උන් වහන්සේ එහි දී කරමින් සිටියේ කුමක් ද ?

**තක්සේරුව :**

- කෙටි ප්‍රශ්නවලට වාචික ව පිළිතුරු සපයයි.

**ප්‍රායෝගික ජීවිතයේ භාවිතය සඳහා**

- සෑම ඉරුදිනක ම ඉරිදා පාසලට සහභාගි වෙමින් දෙවියන් වහන්සේ ගැන ඉගෙන ගැනීම.

## 4.0 තේමාව : ජේසුස් වහන්සේ හඳුනා ගැනීම

**නිපුණතාව** : **ජේසුස් වහන්සේ හඳුනා ගනියි. අනුගමනය කරයි.**

**ඉගෙනුම් පල** : 4.2

- ජේසුස් වහන්සේ බව්තීස්ම වූ ආකාරය චිත්‍රයක් මඟින් ඉදිරිපත් කරයි.

**ඉගෙනුම් සම්පත්** :

- ශුද්ධ බයිබලය (මාර්ක් 1 : 9 - 11)
- ජේසුස් වහන්සේ ජෝර්දාන් ගඟේ ස්නාවක ජොහාන් අතින් බව්තීස්ම ස්නාපනය ලබන අයුරු දැක්වෙන පින්තූරයක්
- ඉහත පින්තූරයේ පිටපත් කිහිපයකින් කපා වෙන් කර ගන්නා ලද චරිත සහිත පින්තූර. එම පින්තූර ඉරටු කූරුවල සවි කර ඇත.
- රිජිෆෝම් කැබැල්ලක්
- රිජිෆෝම් පුවරුව නිල් පාටින් වර්ණ ගැන්වීම සඳහා අවශ්‍ය පාට (*උදා* : දිය සායම්)
- ගම් වර්ගයක්

## ඉගෙනුම් - ඉගැන්වීම් ක්‍රමෝපාය

පියවර 1 :

- පාසල් වත්තේ සුදුසු ස්ථානයකට සිසුන් රැගෙන යන්න.
- පහසු ලෙස වාඩි වන්නට සලස්වන්න.
- දේවස්ථානයක බව්තීස්මයක් සිදු කරන අවස්ථාවක් දැක ඇත් දැයි විමසන්න. පිළිතුරු ලබා ගනිමින් ජේසුතුමාගේ බව්තීස්මය පිළිබඳ ව සිසුන් සමඟ සාකච්ඡා කරන්න.

පියවර 2 :

- ජේසුස් වහන්සේ බව්තීස්මය ලබන චිත්‍රය ප්‍රදර්ශනය කරන්න. දකින දේ පිළිබඳ ව සිසුන් සමඟ සාකච්ඡා කරන්න.
- මාර්ක් 1 : 9 - 11 සිසුන්ට ඇසෙන සේ බයිබල් කොටස කියවන්න.
- සිසුන්ගේ අදහස් විමසමින් ජේසුස් වහන්සේ ජෝර්දාන් ගඟේ දී, ස්නාවක ජොහාන් අතින් බව්තීස්ම ස්නාපනය ලැබූ බව පහදා දෙන්න.

පියවර 3 :

- සිසුන්ට රිජිෆෝම් වර්ණ ගැන්වීමේ ද්‍රව්‍ය, බව්තීස්ම ස්නාපනය ලැබූ අයගේ රූප ලබා දෙන්න.
- රිජිෆෝම් පුවරුව ගඟක් ආකාරයට වර්ණ ගන්වා නිර්මාණය කරන්නටත්, ඒ මත වර්ණ ගැන් වූ පින්තූර සවි කරමින් ජෝර්දාන් ගඟේ ජේසුස් වහන්සේගේ බව්තීස්මය සිදු වූ ආකාරය දැක්වෙන ආකෘතියක් ගොඩනඟන්නටත් උපදෙස් ලබා දෙන්න.
- එය ප්‍රදර්ශනය කරන්න.

**තක්සේරුව :**

- ජේසුස් වහන්සේ බව්තීස්ම ස්නාපනය ලැබීම ආකෘතියක් මඟින් නිර්මාණය කරයි.

**ප්‍රායෝගික ජීවිතයේ භාවිතය සඳහා**

- බව්තීස්මය ඔස්සේ දෙවියන් වහන්සේට අයත් වන බව වටහාගෙන, උන් වහන්සේට අයත් ලෙස ජීවත් වීම.

# 4.0 තේමාව : ජේසුස් වහන්සේ හඳුනා ගැනීම

**නිපුණතාව** : **ජේසුස් වහන්සේ හඳුනා ගනියි. අනුගමනය කරයි.**

**ඉගෙනුම් පල** : 4.3

- ජේසුස් වහන්සේ මවට සවන් දෙමින් යහපත් ප්‍රතිචාර දැක් වූ ආකාරය ආදර්ශයට ගෙන එම සිදුවීමට අදාළ චිත්‍ර වර්ණ ගන්වයි. අංකනය කරයි.

**ඉගෙනුම් සම්පත්** :

- $A_4$ කඩදාසි
- ශුද්ධ බයිබලයේ ජොහාන් 2:1 - 11
- ගල් භාජන 6 දැක්වෙන පිටපත් කීපයක් (සිසු සංඛ්‍යාව අනුව)

## ඉගෙනුම් - ඉගැන්වීම් ක්‍රමෝපාය

පියවර 1 :
- දේව වචනයට ඇහුම්කන් දීමට සිසුන් යොමු කරවමින් ශුද්ධ බයිබලයේ ජොහාන් 2 : 1- 11 කොටස සිසුන්ට ඇසෙන සේ කියවන්න.
- ආකර්ෂණය වන අයුරින් කථාව ඉදිරිපත් කරන්න.

පියවර 2 :
- මංගල අවස්ථාවකට සහභාගි වූ විට එහි ආහාර පාන හිඟ වුවොත් ඇති වන තත්ත්ව පිළිබඳ ව සිසුන්ගෙන් විමසන්න.
- ජේසුස් වහනසේ තම මවට කීකරු වූ ආකාරය පිළිබඳ ව අවධානය යොමු කරන්න.
- ජේසුස් වහන්සේ එහි සිටි නිසා එම හිඟය පියවීමට හැකි වූ බවත්,
- ජේසුස් වහන්සේ එදින ප්‍රාතිහාර්යයක් කළ බවත්, ඒ මඟින් ඒ නිවසට මහත් ප්‍රීතියක් ඇති කළ බවත් සිසුන්ට අවබෝධ කරන්න.

පියවර 3 :
- ගල් භාජන 6 දැක්වෙන පිටපත් කිහිපයක් දරුවන් අතර බෙදා දෙන්න. ඒවා වර්ණ ගන්වා 1 - 6 තෙක් අංකනය කිරීමට සලස්වන්න.

**තක්සේරුව :**

- ගල් භාජන 6 වර්ණ ගන්වා 1 - 6 තෙක් අංකනය කරයි.

**ප්‍රායෝගික ජීවිතයේ භාවිතය සඳහා**

- තම මවට, පියාට කීකරු වෙමින් යුතුකම් ඉටු කරමින්, යහපත් කිතුනු දරුවකු ලෙස ජීවත් වීම.

## 5.0 තේමාව : ජේසුස් වහන්සේගේ ජීවිතයේ සුවිශේෂ වටිනාකම් හඳුනා ගැනීම

**නිපුණතාව** : ජේසුස් වහන්සේගේ ජීවිතයේ සුවිශේෂ වටිනාකම් හඳුනා ගැනීම.

**ඉගෙනුම් පල** : 5.1

- දේව මැවිල්ල පෝෂණය කරන දෙවි පියාණන් වහන්සේ අපට සියල්ල සපයා දෙන බව විශ්වාසයෙන් අදහමින් උන් වහන්සේට තුති පුදමින් යාච්ඤා කරයි.
- මානෙල් මල් පුවරුවක හා කුරුලු කැදැල්ලක ආකෘති නිර්මාණය කරයි.

**ඉගෙනුම් සම්පත්** :

- මානෙල් මල්වලින් පිරුණු විලක හෝ පොකුණක හෝ වර්ණවත් පින්තූරයක්
- නිල් පාටින් හා කොළ පාටින් වර්ණ ගන්වන ලද පොල්කුඩු දැමූ වැලි පුවරුවක්
- ශුද්ධ බයිබලය (මතෙව් 6 : 25 - 28)
- $A_4$ කඩදාසිවලින් කපා නිර්මාණය කර ඉරටු කූරක සවි කරන ලද මානෙල් මල් (සිසුන් සංඛ්‍යාව අනුව)
- කුරුලු කැදැල්ලක ආකෘතියක් නිර්මාණය කිරීමට අවශ්‍ය දෑ

### ඉගෙනුම් - ඉගැන්වීම් ක්‍රමෝපාය

පියවර 1 :
- දෙමාපියන් හා වැඩිහිටියන් සිසුන්ගේ අවශ්‍යතා ඉටු කරන ආකාරය පිළිබඳ ව සාකච්ඡාවක් මෙහෙයවන්න.

පියවර 2 :
- බයිබල් කොටසේ අඩංගු දේ (මතෙව් 6 : 25-28) සිසුන්ට පහදා දෙන්න. සිසුන්ට මානෙල් මල් බෙදා දෙන්න.
- පෙර සකසන ලද වැලි පුවරුව මත මානෙල් මල් රැඳවීමට සිසුන්ට උපදෙස් දෙන්න.
- දෙවියන් වහන්සේ මල්වලට අලංකාරය, මනහර බව ලබා දී තිබෙන බව, ආකාසේ කුරුල්ලන් පවා පෝෂණය කරන බව, එසේ ම දෙවියන් වහන්සේ අප ගැන සොයා බලා අපගේ අවශ්‍යතා ඉටු කරන බව අවධාරණය කරන්න.

පියවර 3 :
- කෝටු කැබලි එකතු කර සාමූහික ව කුරුලු කූඩුවක් නිර්මාණය කිරීමට සලස්වන්න.
- ඒ මත කලින් සූදානම් කරන ලද කුරුලු පවුලක් රඳවන්න.
- දෙවියන් වහන්සේ තම මැවිල්ල පෝෂණය කරන බව අවධාරණය කරවන්න.

**තක්සේරුව :**

- කුරුලු කැදැල්ලේ ආකෘතිය නිර්මාණය කරයි.

**ප්‍රායෝගික ජීවිතයේ භාවිතය සඳහා**

- අපේ ජීවිත අලංකාර කර ගැනීමට දෙවි පියාණන් වහන්සේ අපට ලබා දෙන දේ වලට තුති පුදමින් දිනෙන් දින ඒවා වර්ධනය කර ගැනීමට යොමු වීම.

## 5.0 තේමාව : ජේසුස් වහන්සේගේ ජීවිතයේ සුවිශේෂ වටිනාකම් හඳුනා ගැනීම

**නිපුණතාව** : **ජේසුස් වහන්සේගේ ජීවිතයේ සුවිශේෂ වටිනාකම් හඳුනා ගැනීම.**

**ඉගෙනුම් පල** : 5.2

- දෙවිඳුන් මැවූ සැම කෙනෙකු තුළ ම වටිනාකමක් ඇති බව තහවුරු කිරීමට ගේ කුරුල්ලන් පිළිබඳ ව ජේසුස් වහන්සේගේ ඉගැන්වීම ඉදිරිපත් කරයි.

**ඉගෙනුම් සම්පත්** :
- ශුද්ධ වූ බයිබලයේ මතෙව් 10:29-31
- කළු ලෑල්ල, හුනු කූරක්

### ඉගෙනුම් - ඉගැන්වීම් ක්‍රමෝපාය

පියවර 1 :
- දෙවිඳුන් මැවූ සැම කෙනෙකු තුළ ම වටිනාකමක් ඇති බව පවසමින් ප්‍රශංසාත්මක ගීතය ගායනා කරන්න.

  දෙවි පියාට තුති වේ වා
  එතුමා අප මැව්ව නිසා
  දෙවිඳුට පැසසුම් වේ වා
  එතුමට අප වටින නිසා

පියවර 2 :
- ශුද්ධ බයිබලයේ මතෙව් 10 : 29-31 සිසුන්ට ඇසෙන පරිදි කියවන්න. එම කොටස සිසුන්ට පැහැදිලි කරන්න.
- කුරුල්ලන් පිළිබඳ ව දෙවිඳුන් සැලකිලිමත් වූයේ එතුමාට කුරුල්ලන් වටින නිසා බවත්
- ගේ කුරුල්ලා කුඩා වුවත් දෙවිඳුන්ගේ රැකවරණය, පෝෂණය ලැබෙන බවත්,
- අපගේ හිස කෙස් ගණන පවා දන්නා මැවුම් කරුවාණන අපට වටිනාකමක් දී ඇති බවත් අවධාරණය කරන්න.

පියවර 3 :
- සිසුන්ට දෙවිඳුන් දී ඇති වටිනාකම් පිළිබඳ ව සිසුන්ගෙන් අදහස් ලබාගන්න.
- ඒවා කළු ලෑල්ලෙහි සටහන් කරන්න.
- පසු ව සිසුන් හා එය කියවා සාකච්ඡා කරන්න.

**තක්සේරුව :**

- තමා තුළ ඇති වටිනාකම් පිළිබඳ ව වාචික ව ඇගයීමක් කරන්න.
- එය කළු ලෑල්ලෙහි සටහන් කරන්න.

**ප්‍රායෝගික ජීවිතයේ භාවිතය සඳහා**

- දෙවිඳුන් මැවූ සැම කෙනෙකු තුළ ම ඇති වටිනාකම් ගැන දෙවිඳුන්ට ස්තුති පුද කරමින් දිනපතා යාච්ඤා කිරීම.

## 5.0 තේමාව : ජේසුස් වහන්සේගේ ජීවිතයේ සුවිශේෂ වටිනාකම් හඳුනා ගැනීම

**නිපුණතාව** : ජේසුස් වහන්සේගේ ජීවිතයේ සුවිශේෂ වටිනාකම් හඳුනා ගැනීම.

**ඉගෙනුම් පල** : 5.3

- ජේසුස් වහන්සේ ඉගැන්වූ යාච්ඤාව ඇසුරෙන් දෙවි පියාණන් වහන්සේ හඳුනා ගනිමින් එම යාච්ඤාව තනි ව ප්‍රකාශ කරයි.

**ඉගෙනුම් සම්පත්** :

- ජේසුස් වහන්සේ ගෝලයන් සමඟ යාච්ඤා කරමින් සිටින වර්ණවත් පෝස්ටරයක්
- ජේසුස් වහන්සේ අපට ඉගැන්වූ යාච්ඤාව කොටස් වශයෙන් ලියන ලද කාඩ්පත්
- කාඩ්පත් බහාලීම සඳහා සුදුසු පෙට්ටියක්
- ස්වාමීන්ගේ යාච්ඤාව ලොකු අකුරින් ලියන ලද තරමක් විශාල ප්‍රමාණයේ පෝස්ටරයක්
- පැනල් බෝඩ් එකක්
- ඩබල් ටේප්

### ඉගෙනුම් - ඉගැන්වීම් ක්‍රමෝපාය

පියවර 1 :

- යාච්ඤා කාලයක් ගත කිරීම සඳහා සුදුසු පරිසරයකට රැගෙන යන්න.
- සිසුන් සුදුසු පරිදි වාඩි කරවන්න.
- ජේසුස් වහන්සේ ගෝලයන් සමඟ යාච්ඤා ඉරියව්වෙන් සිටින වර්ණවත් පින්තූරය ප්‍රදර්ශනය කරන්න.
- පින්තූරයේ දකින්නට ලැබෙන දේ ඉදිරිපත් කිරීමට අවස්ථාව ලබා දෙමින් ඒ පිළිබඳ ව සිසුන් සමඟ සාකච්ඡා කරන්න.

පියවර 2 :

- 'දිනපතා දෙවිපියාණන් වහන්සේට යාච්ඤා කරන ළමයින්ට අත් ඉහළට ඔසවන්න' කියමින් ඒ අය ව අගය කරන්න. දවසේ යාච්ඤා කරන අවස්ථා අසා දැනගනිමින්, දිනපතා අපට යාච්ඤා කළ හැකි අවස්ථා පහදා දෙන්න.
- සිසුන්ට ඇසෙන පරිදි මතෙව් 6 : 9 - 13 බයිබල් කොටස කියවන්න.
- බයිබල් කොටස පහදා දෙමින් ජේසුස් වහන්සේ දින පතා යාච්ඤා කළ බවත්, අපටත් යාච්ඤා කරන්නට උගන්වන ලෙස ගෝලයන් උන් වහන්සේගෙන් ඉල්ලා සිටි බවත්, උන් වහන්සේ දින පතා කිරීමට සුදුසු යාච්ඤාවක් ගෝලයන්ට ඉගැන්වූ බවත් කියා දෙන්න.

පියවර 3 :

- 'ජේසුස් වහන්සේ ගෝලයන්ට ඉගැන්වූ යාච්ඤාව අද අපි ඉගෙන ගනිමු.' කියමින් එම යාච්ඤාව ලියන ලද පෝස්ටරය පන්තියේ ප්‍රදර්ශනය කරන්න.
- ගුරුතුමී අනුගමනය කරමින් යාච්ඤාව ශබ්ද නඟා කියවන්නට උපදෙස් දෙමින් කිහිප වරක් එසේ අනුගමනය කරමින් කීමට සලස්වන්න.
- එම යාච්ඤාවේ අඩංගු කාරණවලට අනුව ජීවිතය ගොඩනඟා ගත යුතු බව පැහැදිලි කරන්න.

**තක්සේරුව :**

- ජේසුස් වහන්සේ ගෝලයන්ට ඉගැන්වූ යාච්ඤාව හඬ නඟා ඉදිරිපත් කරයි.

**ප්‍රායෝගික ජීවිතයේ භාවිතය සඳහා**

- දින පතා ස්වාමීන් වහන්සේගේ යාච්ඤාව භාවිත කිරීම.

## 6.0 තේමාව : ශුද්ධාත්මයාණන් වහන්සේ හඳුනා ගැනීම

**නිපුණතාව** : ශුද්ධාත්මයාණන් වහන්සේ හඳුනා ගනියි.

**ඉගෙනුම් පල** : 6.1

- ප්‍රේමය, ප්‍රීතිය, සාමය, ශුද්ධාත්ම ඵල බව විශ්වාස කරමින් එම ඵල නම් කරන ලද පුවරු අලංකාර ලෙස සරසයි.
- ශුද්ධාත්ම ඵල පිළිබඳ විරිඳු ගායනා කරමින් රංගනයක යෙදෙයි.

**ඉගෙනුම් සම්පත්** :

- ශුද්ධ බයිබලය, ගලාති 5 : 22
- රබාන (හෝ වෙනත් ආදේශක සංගීත භාණ්ඩ)
- ප්‍රේමය, ප්‍රීතිය, සාමය ලෙස ලියන ලද කාඩ්පත්
- වචන රැඳවීම සඳහා නිර්මාණ පුවරුවක්
- $A_4$ කඩදාසි

**මාතෘකාව** : ප්‍රේමයයි, ප්‍රීතියයි, සාමයයි

### ඉගෙනුම් - ඉගැන්වීම් ක්‍රමෝපාය

පියවර 1 :

- අප සිත් තුළ පවතින ප්‍රේමය, ප්‍රීතිය, සාමය අපට ලැබෙන්නේ ශුද්ධාත්මයාණන් වහන්සේගෙන් බව පහදා දෙන්න.
- ශුද්ධ බයිබලයේ ගලාති 5 : 22 පදය කියවන්න.
- ප්‍රේමය, ප්‍රීතිය, සාමය යන ගුණාංග සිසුන් ජීවිතයේ අත්දැක ඇති අවස්ථා පිළිබඳ ව සාකච්ඡාවක් මෙහෙයවන්න. එහි දී එම ගුණාංග මොනවා දැයි අවධාරණය කරන්න.
- සිසුන් තුළ ඇති ප්‍රේමය, ප්‍රීතිය, සාමය යන ගුණාංග ශුද්ධාත්මයාණන් වහන්සේ ලබා දුන් ගුණාංග බව පැහැදිලි කරන්න.

පියවර 2 :

- ප්‍රේමය, ප්‍රීතිය, සාමය ලෙස වෙන් වෙන් ව ලියන ලද නම් දැක්වෙන කාඩ්පත් නිර්මාණ පුවරුවක අලංකාර ලෙස අලවන්නට අවස්ථාව ලබා දෙන්න.

පියවර 3 :

- සිසුන් සමඟ එක් ව පහත සඳහන් විරිඳුව ගායනා කරමින් රංගනයක යෙදෙන්න.

අපි සැමට ම ප්‍රේම කරමු
සැමහට සාමය පතුරමු
සියලු දනට ප්‍රීති ගෙනෙමු
ප්‍රේමය, ප්‍රීතිය පතුරමු
සුදතුම් දෙව්ඳුන් ගෙනදුන්
ප්‍රේමය, ප්‍රීතිය පතුරමු

**තක්සේරුව :**

- විරිඳුව තාලයට ගායනා කරමින් රංගනයක යෙදෙයි.

**ප්‍රායෝගික ජීවිතයේ භාවිතය සඳහා**

- අන් අය සමඟ ප්‍රේමයෙන්, ප්‍රීතියෙන්, සාමයෙන් ජීවත් වීමට යොමු වීම.

## 7.0 තේමාව : දේව රාජ්‍යයේ වටිනාකම් අනුව ක්‍රියා කිරීම

**නිපුණතාව** : දේව රාජ්‍යයේ වටිනාකම් අනුව ක්‍රියා කරයි.

**ඉගෙනුම් පල** : 7.1

- ඒසව් සහ ජාකොබ් සහෝදර බැම්මෙන් ක්‍රියා කළ ආකාරය අගය කරමින් එම කථාව රංගනයකින් ඉදිරිපත් කරයි.

**ඉගෙනුම් සම්පත්** :
- ශුද්ධ බයිබලය (උත්පත්ති 33 : 3 - 11)
- අදාළ සිද්ධිය ඇතුළත් පින්තූර පතක්

**මාතෘකාව** : සමඟි වූ සහෝදරයෝ

### ඉගෙනුම් - ඉගැන්වීම් ක්‍රමෝපාය

**පියවර 1 :**
- උත්පත්ති 33 - 3 - 11 බයිබල් පදය සිසුන්ට ඇසෙන පරිදි කියවන්න.
- ජාකොබ් ඒසව් හා සමඟි වූ ආකාරය දැක්වෙන කථාව පින්තූර පතක් ආශ්‍රයයෙන් සිසුන්ට රසවත් ව ඉදිරිපත් කරන්න.
- පහත කරුණු ඉස්මතු කරන්න.
  - * ජාකොබ් හා ඒසව් සහෝදරයන් වුවත්, කාලයක් හමු නොවී වෙන් ව ජීවත් වූ බව
  - * ජාකොබ් ඒසව් බදාගෙන, ගෙල වැළඳගෙන සිපගත් බව
  - * සහෝදරයන් දෙදෙනා ම අඬන්නට වූ බව
  - * ඒසව්, ජාකොබ්ට සමාව දුන් බව හා සමඟි වූ බව
  - * අප සැම දා ම සහෝදර බැඳීමෙන් ජීවත් විය යුතු බව

**පියවර 2 :**
- ඒසව් සහ ජාකොබ් සහෝදර බැම්මෙන් ක්‍රියා කළ ආකාරය දැක්වෙන කථාව රංගනයක් මඟින් ඉදිරිපත් කිරීමට සිසුන්ව යොමු කරන්න.

**පියවර 3 :**
- සුළු දේවල් සඳහා සහෝදර - සහෝදරියන් සමඟ අසමාදාන වූ අවස්ථා පිළිබඳ ව සිසුන්ගෙන් විමසන්න.
- එම අවස්ථාවල ඔවුන්ගේ හැඟීම් හා පසු ව ඔවුන් සමාදාන වූ පසු, ඇති වන හැඟීම් අතර වෙනස පිළිබඳ ව කථා කිරීමට අවකාශ සකසන්න.
- සාමයෙන් බැඳී සහෝදරයන් මෙන් ජීවත් වීම දේව කැමැත්ත බව අවධාරණය කරන්න.

**තක්සේරුව :**

- ඒසව් හා ජාකොබ් සමඟි වූ ආකාරය පිළිබඳ රංගනයක යෙදෙයි.

**ප්‍රායෝගික ජීවිතයේ භාවිතය සඳහා**

- සැම දෙනා සමඟ ම සහෝදර බැම්මෙන් ජීවත් වීම

## 7.0 තේමාව : දේව රාජ්‍යයේ වටිනාකම් අනුව ක්‍රියා කිරීම

**නිපුණතාව** : දේව රාජ්‍යයේ වටිනාකම් අනුව ක්‍රියා කරයි.

**ඉගෙනුම් පල** : 7.2

- දාවිත් හා ජොනතන් මිත්‍රත්වයෙන් ක්‍රියා කළ ආකාරය ආදර්ශයට ගනිමින්, එම කථාවට අදාළ බයිබල් පදයක් ලියූ, පොත් සලකුණක් එකිනෙකා අතර හුවමාරු කර ගනියි.

**ඉගෙනුම් සම්පත්** :

- ශුද්ධ බයිබලය 1 සාමුවෙල් 20 ඃ 41/b - 42)
- සිසුන් අතර හුවමාරු කර ගැනීමට යොදාගත් කාඩ්පත් (පන්තියේ සිටින සිසුන් ගණන අනුව, අදාළ පාඨ ලියා, පොත් සලකුණක හැඩයට කපා ගන්න.)

**මාතෘකාව** : සැබෑ මිතුරෝ

### ඉගෙනුම් - ඉගැන්වීම් ක්‍රමෝපාය

පියවර 1 :

- ශුද්ධ බයිබලයේ 1 සාමුවෙල් 20 ඃ 41/b - 42 බයිබල් පදය කියවන්න.
- දාවිත් හා ජොනතන් අතර වූ මිත්‍රත්වය පිළිබඳ වූ කතා පුවත සිසුන්ට අවබෝධ වන සේ සාකච්ඡාවක් මෙහෙයවන්න.
- ජොනතන් සාවුල් රජුගේ පුත්‍රයා බවත්,
- ජොනතන් දාවිත්ට ප්‍රේම කළ මිතුරකු බවත් මෙහි දී කථා පසුබිම ලෙස සිසුන්ට අවබෝධ කර දෙන්න.
- කරදරයට පත් ව සිටි තම මිත්‍ර දාවිත් හමු වූ ජොනතන් සිඹගෙන හැඬූ බව පහදා දෙන්න.
- සැබෑ මිතුරන් නම් අන් අයගේ ශෝකයේ දී ඔවුන්ගේ ශෝකයට හවුල් විය යුතු බව කියා දෙන්න.

පියවර 2 :

- සිසුන් දෙදෙනා බැගින් කණ්ඩායම් කරන්න.
- පෙර සකස් කරගත් පොත් සලකුණු සිසුන් අතර බෙදා දෙන්න.
- පොත් සලකුණේ කඩඉරිවලින් ලියා ඇති 'සැබෑ මිතුරෝ' යන වචනය මත සිසුන්ට ලිවීමට සලස්වන්න.
- පසුව එම පොත් සලකුණු තම මිතුරා සමඟ හුවමාරු කර ගැනීමට අවස්ථාව සලසා දෙන්න.

**තක්සේරුව :**

- 'සැබෑ මිතුරෝ' යන්න කඩඉරි මත ලියයි.

**ප්‍රායෝගික ජීවිතයේ භාවිතය සඳහා**

- සැම දෙනා සමඟ මිත්‍රත්වයෙන් ක්‍රියා කිරීම

## 7.0 තේමාව : දේව රාජ්‍යයේ වටිනාකම් අනුව ක්‍රියා කිරීම

**නිපුණතාව** : දේව රාජ්‍යයේ වටිනාකම් අනුව ක්‍රියා කරයි.

**ඉගෙනුම් පල** : 7.3

- දාවිත් මෙපිබෝෂෙත් රැකබලා ගත් ආකාරය ඉගෙන ගනිමින්, කෙටි ප්‍රශ්න කිහිපයකට වාචික ව පිළිතුරු ලබා දෙයි.

**ඉගෙනුම් සම්පත්** :
- ශුද්ධ බයිබලය 2 සාමුවෙල් 9 : 1 - 13
- 2 සාමුවෙල් 9 : 1 - 13 බයිබල් පාඨයට අදාළ පින්තූර පත්
- කෙටි වාචික ප්‍රශ්න

**මාතෘකාව** : දාවිත් දැක්වූ කරුණාව

### ඉගෙනුම් - ඉගැන්වීම් ක්‍රමෝපාය

**පියවර 1 :**
- ශුද්ධ බයිබලයේ 2 සාමුවෙල් 9:1 - 13 බයිබල් පාඨය සිසුන්ට ඇසෙන සේ කියවන්න.
- දාවිත් රජතුමා මෙපිබෝෂෙත්ට කරුණාව දැක්වූ ආකාරය පින්තූර මඟින් සිසුන්ට රසවත් ව ඉදිරිපත් කරන්න. එහි දී පහත කරුණු ඉස්මතු කරන්න.
  - * දාවිත් රජු දෙවියන් වහන්සේගේ කරුණාව ලැබූ රජ කෙනකු බව
  - * මෙපිබෝෂෙත් යනු සාවුල් රජුගේ පුත් ජොනතන්ගේ පුත්‍රයා බව
  - * දෙවියන් වහන්සේගේ කරුණාව දාවිත් රජු වෙතින් මෙපිබෝෂෙත් වෙත ගලා ගිය බව
- දාවිත් රජු තමාගෙන් ඉටුවිය යුතු යුතුකම් තම වගකීමක් ලෙස සලකා මෙපිබෝෂෙත්ට කරුණාව දැක්වූ ආකාරය සිසුන්ට පහදා දෙන්න.

**පියවර 2 :**
- දාවිත් රජතුමා මෙපිබෝෂෙත් රැක බලාගත් ආකාරය ඉගෙන ගනිමින් කෙටි ප්‍රශ්න කිහිපයකට වාචික ව පිළිතුරු ලබාදීමට සලස්වන්න.
  1. මෙපිබෝෂෙත්ට දේව කරුණාව දැක්වූයේ කවරෙක් ද ?
  2. මෙපිබෝෂෙත්ගේ පියාගේ නම කුමක් ද ?
  3. දාවිත් රජුට මෙපිබෝෂෙත් පිළිබඳ ව දැන්වූයේ කවරෙක් ද ?
  4. මෙපිබෝෂෙත්ගේ ශරීරයේ තිබූ ආබාධය කුමක් ද ?
  5. ඔබ යම් කෙනකුට කරුණාව දක්වමින් කළ උපකාරයක් සඳහන් කරන්න.

**තක්සේරුව :**

- ශුද්ධ බයිබලයේ 2 සාමුවෙල් 9 : 1 - 13 ඇසුරින් කෙටි වාචික ප්‍රශ්න සඳහා පිළිතුරු දෙයි.

**ප්‍රායෝගික ජීවිතයේ භාවිතය සඳහා**

- සමාජය තුළ අන් අය වෙත කරුණාව පාමින් ක්‍රියා කිරීම

## 7.0 තේමාව : දේව රාජ්‍යයේ වටිනාකම් අනුව ක්‍රියා කිරීම

**නිපුණතාව** : දේව රාජ්‍යයේ වටිනාකම් අනුව ක්‍රියා කරයි.

**ඉගෙනුම් පල** : 7.4

- වපුරන්නාගේ උපමාව අවබෝධ කර ගනිමින් එහි අවස්ථා ආකෘතියක් මඟින් ඉදිරිපත් කරයි.

**ඉගෙනුම් සම්පත්** :

- ශුද්ධ බයිබලය - ලූක් 8 : 4 - 8
- ප්ලැටිග්නම්, පාටකුරු
- ගම්
- වී ඇට ස්වල්පයක්
- වැලි
- ඉතා කුඩා ගල්කැට
- කටු පඳුරු ඇඟවීමට නිදිකුම්බා හෝ වෙනත් ආදේශකයක්
- තණකොළ නැතහොත් ආදේශකයක් ද රැගෙන ඒමට උපදෙස් දෙන්න.

මාතෘකාව : 'පල දරන බිමක් වෙමි.'

### ඉගෙනුම් - ඉගැන්වීම් ක්‍රමෝපාය

පියවර 1 :
- සිසුන් පන්ති කාමරයෙන් පිටත පරිසරයට රැගෙන යන්න.
- ශුද්ධ බයිබලයේ ලූක් 8 : 4 - 8 දක්වා සිසුන්ට ඇසෙන පරිදි කියවන්න.
- පෙර පුහුණු කර සූදානම් කරගත් පරිදි වපුරන්න ලෙස සැරසුණු සිසුවකු ගෙන්වන්න. (ගුරුවරයාට සුදුසු පරිදි එම සිසුවා තෝරා ගන්න.)
- වපුරන්නා එන මාර්ගයේ ද, දෙවනු ව ගල් අතර ද, තෙවනු ව කටු පඳුරේ ද, හතර වනු ව සරු බිමක් මත ද සංකේතානුසාරයෙන් වී ඇට ඉසීමට උපදෙස් දෙන්න.

පියවර 2 :
- බීජ වැටුණු ස්ථාන 4 පිළිබඳ ව ප්‍රශ්න අසමින් සාකච්ඡාවක් මෙහෙයවන්න.

පියවර 3 :
- සිසුන්ට අවශ්‍ය $A_4$ කඩදාසි බෙදා දෙන්න.
- අවට පරිසරයේ ඇති වැලි, ඉතා කුඩා ගල් කැට, නිදිකුම්බා පැළැටි, තණකොළ හා අවශ්‍ය දෑ පන්ති කාමරයට ගෙන ඒමට උපදෙස් ලබා දෙන්න.
- වපුරන්නාගේ උපමාවට අයත් බීජ වැටුණු ස්ථාන හතර ද, ඒ මත වැටුණු බීජ ද, $A_4$ කඩදාසිය මත අනුපිළිවෙළින් අලවා නිර්මාණය කර ගැනීමට සිසුන්ට අවස්ථාව සලසන්න.
- බීජ වැටුණු ස්ථාන සතර පිළිබඳ දේව වචනයට සම්බන්ධ කරමින් සරල අර්ථකථනයක් ඉදිරිපත් කරන්න.
- සරුබිමේ වැටුණු බීජයක් මෙන් දේව වචනයට අනුව සාර්ථක දිවියක් ගත කරන කිතුනු දරුවකු වීමේ වැදගත්කම තහවුරු කරන්න.

**තක්සේරුව :**

- වපුරන්නාගේ උපමා කථාව ආකෘතියක් මඟින් ඉදිරිපත් කරයි.

**ප්‍රායෝගික ජීවිතයේ භාවිතය සඳහා**

- දේව වචනයට අනුව ක්‍රියා කරන සරුබිමේ වැටී පල දරන සිසුවකු වීම

## 8.0 තේමාව : ශුද්ධ බයිබලය ජීවිතයට අදාළ කර ගැනීම

**නිපුණතාව** : ශුද්ධ බයිබලයට අනුව දිවි ගෙවයි.

**ඉගෙනුම් පල** : 8.1

- රජ කුමරියක මඟින් මෝසෙස් දේව රැකවරණය අත්දුටු සිදුවීම ප්‍රකාශ කරයි.
- රජ කුමරියක මඟින් මෝසෙස් දේව රැකවරණය අත්දුටු සිදුවීම හරහා දේව රැකවරණය පිළිබඳ විශ්වාසය තහවුරු කර ගනිමින් එම සිදුවීමට අදාළ රූප පෙළක් සාමූහික ව නිර්මාණය කරයි.

**ඉගෙනුම් සම්පත්** :
- ශුද්ධ බයිබලය (නික්මයාම 2 : 1 - 10)
- නයිල් ගඟේ පන් පෙට්ටියක් තබා ඇති ආකෘතියක්
- මීරියම් දැක්වෙන අත්රූකඩයක්
- කතාවට අදාළ ව සකස් කොට අයිස්ක්‍රීම් කෝටුවල සවි කර ගත් විශාල කාඩ්බෝඩ්/බ්‍රිස්ටල් බෝඩ් රූප

**මාතෘකාව** : දේව රැකවරණය අත්දුටු මෝසෙස්

### ඉගෙනුම් - ඉගැන්වීම් ක්‍රමෝපාය

**පියවර 1 :**
- සිසුන්ට ඇසෙන සේ නික්මයාම 2 : 1 0 10 කොටස කියවන්න.
- නයිල් ගඟේ පන් පෙට්ටියක් තබා ඇති ආකෘතිය පන්තිය තුළ තබා, පන්තිය සකස් කරගන්න.
- ගුරුතුමී/ගුරුතුමා මීරියම් දැක්වෙන අත්රූකඩය පැලඳ ගන්න.
- මීරියම් ඉදිරිපත් කරන අයුරින් රජ කුමරියක මඟින් මෝසෙස් දේව රැකවරණය ලැබූ සිදුවීම බයිබල් පාඨයට අනුව රසවත් ව සිසුන්ට ඉදිරිපත් කරන්න.
- පහත කරුණු අවධාරණය කරන්න.
  - * මෝසෙස් ඉපදුණු කාලයේ කුඩා පිරිමි දරුවන්ට රජතුමා වෙතින් ජීවිත තර්ජන එල්ල වූ බව හා මෝසෙස්ගේ මව තෙමසක් මෝසෙස් නිවසෙහි සඟවා ගත් බව
  - * ඉන් පසු ව මෝසෙස් පන් පෙට්ටියක සඟවා නයිල් ගඟේ පාකර යැවූ බව හා මෝසෙස්ගේ සොහොයුරිය වූ මීරියම් සැඟවී මෝසෙස් රැකවල් කළ අයුරු
  - * නයිල් ගඟේ දිය නෑමට පැමිණි පාරාවෝ රජුගේ දුව හා සේවිකාවන් පන් පෙට්ටියේ සිටි මෝසෙස් සොයාගත් ආකාරය
  - * කිරි දී හදාවඩා ගැනීම සඳහා මෝසෙස්ගේ මවට භාර කිරීම හා මෝසෙස් වැඩුණු පසු ඔහුගේ මව විසින් මෝසෙස් රජ කුමරියට භාර දීම
  - * එම සිදුවීම මඟින් මෝසෙස් දේව රැකවරණය අත්දුටු ආකාරය

**පියවර 2 :**
- මෝසෙස් දේව රැකවරණය අත්දුටු ආකාරය පිළිබඳ සරල ප්‍රශ්න කීපයක් අසා පිළිතුරු ලබාගන්න.
- දෙවියන් වහන්සේ අප නිරතුරු ව ම රැකගන්නා ආකාරය සාකච්ඡා කරන්න.
- දේව රැකවරණය පිළිබඳ විශ්වාසය සිසුන් තුළ තහවුරු කරන්න.

**පියවර 3 :**
- සිසුන් කණ්ඩායම්ගත කරන්න. නැතිනම් පන්තියේ සිටින සිසුන් තනි තනි ව සම්බන්ධ කරගන්න.
- ගුරුවරයා කතාවට අදාළ රූප කලින් නිර්මාණය කර විවිධ කණ්ඩායම්වලට හෝ සිසුවකුට (රූපය බැගින්) හෝ ලබා දෙන්න.

- එම රූපය අලංකාර ලෙස පාට කිරීමට උපදෙස් දෙන්න.
- සියලු රූප නිර්මාණය කර අවසන් වූ පසු අදාළ කණ්ඩායමට/සිසුවාට ඉදිරියට පැමිණ නයිල් ගඟේ පන් පෙට්ටිය දක්වෙන ආකෘතිය මත හෝ ඊට ආසන්න ව හෝ එය සිටුවීමට/සකස් කිරීමට සලස්වන්න.
- ඉන් පසු කතාව මතකයෙන් කීමට එක් එක් සිසුවාට අවස්ථාව දෙන්න.
- සිසුන් සමග එක් ව දේව රැකවරණය ගැන තුති පුදමින් යාච්ඤාවේ යෙදෙන්න.

**තක්සේරුව :**

- රජ කුමරියක මඟින් මෝසෙස් දේව රැකවරණය අත්දුටු කතාන්දරය මතකයෙන් කියයි.

**ප්‍රායෝගික ජීවිතයේ භාවිතය සඳහා**

- ලොව දිවි ගෙවන සෑම දරුවකු ම දේව රැකවරණය පතා යාච්ඤා කිරීමට යොමු වීම.

## 8.0 තේමාව : ශුද්ධ බයිබලය ජීවිතයට අදාළ කර ගැනීම

**නිපුණතාව** : ශුද්ධ බයිබලයට අනුව දිවි ගෙවයි.

**ඉගෙනුම් පල** : 8.2

- දෙවියන් වහන්සේගේ අසීමිත කමාව හා ප්‍රේමය තහවුරු කෙරෙන නැති වූ පුත්‍රයාගේ උපමාව රඟදක්වයි.
- දෙවියන් වහන්සේගේ අසීමිත කමාව හා ප්‍රේමය යන වදන් නිර්මාණාත්මක ව ඉදිරිපත් කරයි.

**ඉගෙනුම් සම්පත්** :

- ශුද්ධ බයිබලය (ශුද්ධ ලූක් 15 : 11 - 24)
- උපමාව රඟදැක්වීමට අවශ්‍ය දෑ
- 'දේව කමාව හා ප්‍රේමය ලබමු' යන්න ලියා මුද්‍රණය කළ කඩදාසි පිටපත්
- පරිප්පු ඇට
- ගම්, පාට පැන්සල්

**මාතෘකාව** : නැති වූ පුත්‍රයාගේ උපමා කතාව

### ඉගෙනුම් - ඉගැන්වීම් ක්‍රමෝපාය

පියවර 1 :

- උපමාව රඟදැක්වීමට කැමති සිසුන්ට පෙර පුහුණුවක් ලබා දෙන්න.
- සිසුන් පන්තියෙන් පිටත එළිමහනකට රැගෙන යන්න.
- බයිබල් කොටස (ශුද්ධ ලූක් 15 : 11 - 24) සිසුන්ට ඇසෙන සේ කියවන්න.
- චරිත රඟදක්වන දරුවන් සූදානම් කරගන්න.
- අනෙක් සියලු දෙනාට අසුන් ගැනීමට සලස්වා නැති වූ පුත්‍රයාගේ උපමා කතාව සරල ව හා රසවත් ව ඉදිරිපත් කරන්න.
- ඒ අතරතුර උපමාව රඟදැක්වීමට සිසුන්ට අවකාශ සලසන්න.
- මෙය ජේසුස් වහන්සේ ඉගැන්වූ අලංකාර උපමාවක් බව කියා දෙන්න.
- පහත සඳහන් කරුණු ඉස්මතු කරන්න.
  - * එක් පියකුට පුතුන් දෙදෙනෙකු සිටි බව හා බාල පුතා තමාට අයත් වස්තුව පියාගෙන් ඉල්ලාගෙන නිවසෙන් පිට ව ගිය බව
  - * මිතුරන් සමඟ එක් ව ඔහු සියල්ල නාස්ති කළ බව හා වස්තුව අවසාන වූ විට සියලු දෙනා ඔහු අතහැර ගිය බව
  - * ජීවත් වීම සඳහා ඔහුට ගොවිපළක ඌරන් බලා ගැනීමට සිදුවූ බව හා ඌරන් බලාගන්නා අතර ඌරන්ට දමන ආහාරවලින් ඔහුට ද කුස පුරවා ගැනීමට සිදු වූ ආකාරය
  - * මෙසේ ජීවත් වන විට පියාගේ ගෙදර ඔහුට මතක් වූ බව හා සේවකයකු ලෙස තමා පිළිගන්නා ලෙස ඉල්ලනවා යැයි සිතා නැවත හැරී ගෙදර ආ බව
  - * පියා පුතා එන තුරු මඟ බලා සිටි බව හා පුතා දැක සතුටු වී ඉතා ආදරයෙන් ඔහු පිළිගත් බව
  - * ඔහුට කමාව දී ප්‍රේමයෙන් ඔහු උදෙසා විශාල උත්සවයක් පැවැත්වූ බව

පියවර 2 :

- නැවත සිසුන් පන්තියට ගෙන එන්න.
- දෙවියන් වහන්සේගේ අසීමිත කමාව හා ප්‍රේමය අපට ද හිමි වන බව තහවුරු කරන්න.
- කමාව හා ප්‍රේමය අඩංගු වාක්‍ය මුද්‍රණය කළ පත්‍රිකා සිසුන්ට ලබා දෙන්න.

- පරිප්පු ඇට භාවිතයෙන් අලංකාර ලෙස එම වාක්‍යය සැරසීමට මඟ පෙන්වන්න.
- සෑම ශිෂ්‍යයකුගේ ම/ශිෂ්‍යාවකගේ ම නිර්මාණ අගය කරන්න.
- ඒවා පන්තියේ අන් සිසුන් ඉදිරියේ ප්‍රදර්ශනය කිරීමට එක් එක් සිසුවාට අවකාශ සලසන්න.
- පසු ව එම නිර්මාණ සිසුන්ගේ අභ්‍යාස පොත්වල ඇලවීමට උපදෙස් දෙන්න.

**තක්සේරුව :**

- 'දේව කමාව හා ප්‍රේමය ලබමු' යන වාක්‍යය නිර්මාණාත්මක ව ඉදිරිපත් කරයි.

**ප්‍රායෝගික ජීවිතයේ භාවිතය සඳහා**

- දින පතා කරන වැරදි පිළිබඳ ව පසුතැවිලි වෙමින් කමාව යැදීම.

## 8.0 තේමාව : ශුද්ධ බයිබලය ජීවිතයට අදාළ කර ගැනීම

**නිපුණතාව** : ශුද්ධ බයිබලයට අනුව දිවි ගෙවයි.

**ඉගෙනුම් පල** : 8.3

- දේව වචනයෙන් තමා දන්නා සරල පදයක් කටපාඩමෙන් කියයි.
- දේව වචනයට අනුව ජීවත් වී ජේසුස් වහන්සේ තුළ සවිය අත්දකිමින් අත්තිවාරම් දෙක මත තැනූ නිවාසවල ආකෘති නිර්මාණය කරයි.

**ඉගෙනුම් සම්පත්** :

- ශුද්ධ බයිබලය (ශුද්ධ මතෙව් 7 : 24 - 27)
- බ්‍රිස්ටල් බෝඩ්, පාට, කතුරු ආදි ආකෘතිය සෑදීමට වුවමනා ද්‍රව්‍ය
- කලින් සාදාගත් නිවාසවල ආකෘති
- දේව වචනයෙන් සරල පදයක් කලින් ඉගෙන ගෙන පැමිණීමට පෙර උපදෙස් දීම.

**මාතෘකාව** : අත්තිවාරම් දෙක

### ඉගෙනුම් - ඉගැන්වීම් ක්‍රමෝපාය

පියවර 1 :

- සිසුන්ට නිහඬ ව අසුන් ගැනීමට සලස්වන්න.
- 'අත්තිවාරමක්' යනු කුමක් දැයි සිසුන්ගෙන් විමසමින් එහි අරුත පහදා දෙන්න.
- දේව වචනය ඉගෙන ගැනීමේ වටිනාකම වටහා දෙන්න.
- සිසුන් එකිනෙකාට තමා දන්නා සරල දේව වචනයෙන් පාඨයක් පන්තියට ඉදිරිපත් කිරීමට අවස්ථාව සලසන්න. (පෙර දැනුම් දීමෙන්)
- ජීවිතයට අත්තිවාරම දේව වදන් බව අවධාරණය කරන්න.

පියවර 2 :

- ශුද්ධ මතෙව් 7 : 24 - 27 පාඨය සිසුන්ට ඇසෙන සේ පැහැදිලි ව කියවන්න.
- එහි සඳහන් අත්තිවාරම් දෙක පිළිබඳ ඉගැන්වීම පැහැදිලි ව හා රසවත් අයුරින් සිසුන්ට කියා දෙන්න.

පියවර 3 :

- සිසුන් කොටස් දෙකකට බෙදා අවශ්‍ය ද්‍රව්‍ය සපයමින්,
  * එක් කොටසකට පර්වතය මත වූ අත්තිවාරමේ ඉදි කළ නිවසේත්
  * අනෙක් කොටසට වැලි මත වූ අත්තිවාරමේ ඉදි කළ නිවසේත් ආකෘති සැකසීමට මඟ පෙන්වන්න.
- සාදා නිම කළ ආකෘති මේසයක් මත ප්‍රදර්ශනය කිරීමට අවකාශ සලසන්න.
- තමා සාදා නිම කළ අත්තිවාරම මත ඇති නිවෙස පිළිබඳ ව අදහස් පළ කිරීමට සිසුන් කිහිප දෙනෙකුට හෝ අවස්ථාව ලබා දෙන්න.
- නැවත පාඩම ඒ හා සම්බන්ධ කර දේව වචනය තුළ මුල් බැස ගැනීමේ වැදගත්කම අවධාරණය කරන්න.
- දේව වචනය මත ජීවිතය ගොඩනඟා ගැනීමට පිහිට ඉල්ලා සිසුන් සමඟ යාච්ඤා කරන්න.

**තක්සේරුව :**

- අත්තිවාරම් මත පිහිටි නිවෙස්වල ආකෘති සකස් කරයි.

**ප්‍රායෝගික ජීවිතයේ භාවිතය සඳහා**

- දින පතා දේව වචනයෙන් සරල කොටසක් වැඩිහිටියකු ලවා කියවා ගැනීම හා ඊට සවන් දීම.

# ක්‍රිස්තියානි ධර්මය තක්සේරු කිරීමේ පත්‍රිකාව

| | |
|---|---|
| ප්‍රවීණතා මට්ටමට පැමිණ ඇත. | √ |
| ප්‍රවීණතා මට්ටමට පැමිණ නැත. | • |

| | | | | | | ශිෂ්‍ය නාම |
|---|---|---|---|---|---|---|
| | | | | | | 1. ළමයින් සෙල්ලම් ගෙදරට ගෙන ගොස් ඔවුන් ගෙනා මල්වලින් සෙල්ලම් ගෙය අලංකාර කර දෙවිඳුන් මැවූ පලතුරු භුක්ති විඳිමින් ප්‍රීතියෙන් ගීතයක් ගයයි. |
| | | | | | | 2. ක්ලේ යොදා ගනිමින් දෙවියන් වහන්සේ මැවූ තමන් කැමති සතකු අඹයි. |
| | | | | | | 3. අංග චලන යොදාගෙන ගීතයක් ඉදිරිපත් කරයි. |
| | | | | | | 4. දේවස්ථානයේ ආකෘතියක සමූහයාගේ පින්තූර ඇඳ සම්පූර්ණ කරයි. |
| | | | | | | 5. අන්‍යොන්‍ය උපකාරය පිළිබිඹු වන අවස්ථාවක පින්තූරයක් වර්ණ ගන්වයි. |
| | | | | | | 6. කිතුනු දරුවකු ලෙස දේව ප්‍රේමයෙන් ඉටු කරන කාර්ය චිත්‍රයට නගයි. |
| | | | | | | 7. කෙටි ප්‍රශ්නවලට වාචික ව පිළිතුරු සපයයි. |
| | | | | | | 8. ජේසුස් වහන්සේ බව්තීස්ම ස්නාපනය ලැබීම ආකෘතියක් මඟින් නිර්මාණය කරයි. |
| | | | | | | 9. ගල් භාජන 6 වර්ණ ගන්වා 1 - 6 තෙක් අංකනය කරයි. |
| | | | | | | 10. කුරුලු කැදැල්ලේ ආකෘතිය නිර්මාණය කරයි. |
| | | | | | | 11. තමා තුළ ඇති වටිනාකම් වාචික ව ප්‍රකාශ කරයි. |
| | | | | | | 12. ජේසුස් වහන්සේ ගෝලයන්ට ඉගැන්වූ යාච්ඤාව හඬ නගා ඉදිරිපත් කරයි. |
| | | | | | | 13. විරිදු ගායනා කරමින් රංගනයක යෙදෙයි. |
| | | | | | | 14. ඒසව් හා ජාකොබ් සමඟි වූ ආකාරය පිළිබඳ රංගනයක යෙදෙයි. |
| | | | | | | 15. 'සැබෑ මිතුරෝ' යන්න කඩඉරි මත ලියයි. |
| | | | | | | 16. ශුද්ධ බයිබලයේ 2 සාමුවෙන් 9:1-13 ඇසුරින් කෙටි වාචික ප්‍රශ්න සඳහා පිළිතුරු දෙයි. |
| | | | | | | 17. වපුරන්නාගේ උපමා කථාව ආකෘතියක් මඟින් ඉදිරිපත් කරයි. |
| | | | | | | 18. රජ කුමරියක මඟින් මෝසෙස් දේව රැකවරණය අත් දුටු කතාන්දරය මතකයෙන් කියයි. |
| | | | | | | 19. 'දේව කමාව හා ප්‍රේමය ලබමු' යන වාක්‍යය නිර්මාණාත්මක ව ඉදිරිපත් කරයි. |
| | | | | | | 20. අත්තිවාරම් මත පිහිටි නිවෙස්වල ආකෘති සකස් කරයි. |